# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

# වාර්ෂික වාර්තාව

# 2013

# සභාපතිතුමාගේ පණිවුඩය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත මගින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවා ඇත.

පාරිභෝගික අධිකාරියේ 2013 වර්ෂයට අදාල මූල්‍යමය සහ මූල්‍යමය නොවන කාර්ය සාධනය අනාවරණය කරන වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව මා සතුටු වෙමි. විශේෂයෙන්ම "තත්ත්වාගනනය නොකළ විගණන මතයක්" සහිතව 2013 පාරිභෝගික අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව වඩාත් සතුටු වෙමි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවා වසර 09ක් ගතවී එළඹෙන මෙම වසර වන විට එහි ප්‍රධාන අරමුණ වන තරඟකාරී වෙළඳ සමාජයක් තුළ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමටත්, දැනුවත් වෙළඳ සමාජ පරිසරයක් බිහිකිරීමත් යන කාර්යයන් සැලකිය යුතු ප්‍රමාණයකින් ළඟාකරගෙන ඇතිබව අපගේ ක්‍රියාකාරිත්ව ප්‍රගතිය තුලින් පිළිඹිබු වන බව මාගේ විශ්වාසයයි. විශේෂයෙන් එසේ අපවෙත ලැබෙන පාරිභෝගික පැමිණිලි මෙන්ම ජනමාධ්‍යය ඔස්සේ කෙරෙන විවේචනයන්ද එම විශ්වාසය තවදුරටත් තහවුරු කර ඇත.

වර්තමාන තරඟකාරී විවෘත ආර්ථික වෙළඳාම තුල අසාධාරණ ලෙස මිළ වැඩිකිරීම, කොන්දේසි සහිත වෙළඳාම, අලෙවිය සීමාකිරීම, අසාධාරණ වෙළඳ කොන්දේසි යන අනිසි වෙළඳ ප්‍රතිපත්ති තුලින් පාරිභෝගික සුබසිද්ධියට පටහැනි දේ සිදුවීම සාමාන්‍ය දෙයකි. මෙවැනි තත්ත්වයක් තුල පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම උදෙසා අපගේ විෂය වපසරියට ගැලපෙන පරිදි දැනට නිකුත් කර ඇති විධානයන්ට අමතරව නව විශේෂ විධානයන් නිකුත් කරමින් මෙම තත්ත්වයන් සමනය කිරීමට උපරිම උත්සාහයක් පවත්නා ව්‍යාපාරික පරිසරය තුල ගෙන ඇත. ඒ අනුව නව නියෝග 05ක් හඳුන්වා දෙන ලද අතර එමගින් සැලකිය යුතු වෙළඳ විෂමාචාර වැලැක්වීමට අධිකාරියට මැදිහත්වීමට අවස්ථාව උදාවුනි. එමෙන්ම රටතුල පවත්වන වැදගත් නියාමන ආයතන වන සෞඛ්‍ය අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා රේගුව වැනි ආයතන සමඟ ඒකාබද්ධව සම්මතයන්ට අනුකූල නොවන ආනයනික වෙළඳ භාණ්ඩ 207ක් අධීක්ෂණයට දායකවෙමින් ඒවා රටතුලට ගෙන්වීම වැලැක්වීම මගින් පාරිභෝගික ආරක්ෂණයට දායක වීමට හැකියාව ලැබිණ. එමෙන්ම වෙළඳපළ දැනුවත් කිරීම් වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම මගින් පාරිභෝගිකයා හා වෙළෙන්දන් දැනුවත් කරමින් වෙළඳපල තුල දැනුවත් පාරිභෝගිකයන් හා වෙළෙන්දන් බිහිකිරීමේ උත්සාහයකද නිරතවිය.

පාරිභෝගික අධිකාරියේ කාර්ය භාරය පිළිබඳ දැනුවත් වූ පාරිභෝගිකයන්ගෙන් අධිකාරිය වෙත ලැබුනු පාරිභෝගික පැමිණිලිවලින් 84% සඳහා සාර්ථක විසඳුම් ලබාදීමට සමත්වූ අතර තෘප්තිමත් වූ මෙම පාරිභෝගිකයන් අධිකාරිය වෙත ප්‍රශංසාත්මක ලිපිද ලබාදී ඇති බව සඳහන් කරන්නේ නිහතමානීවය.

නිශ්චිත හා අත්‍යාවශ්‍ය භාණ්ඩ ලෙස අධිකාරිය විසින් හඳුනාගෙන ඇති භාණ්ඩ වර්ග 14ක දෛනික වෙළඳපල මිල ගණන් පිළිබඳ විමසිල්ලෙන් සහ අධ්‍යයනයෙන් පසු මිල අඩුකිරීමකට හෝ මිල වැඩිවීමක් නම් එය නිසි අධ්‍යයනයකින් හා වියදම් විශ්ලේෂනයකින් අනතුරුව අවම මිල වැඩිවීමකට සීමාකිරීමටද උත්සාහ දරා ඇත.

මෙසේ වෙළඳපළ විධිමත් කිරීමේ කාර්යයන් සිදුකරන අතර වෙළඳපල නීතිරීතීන් අනුගමනය නොකරන වෙළෙන්දන් නීතියේ රැහැනට හසුකරගැනීමට වෙළඳපල වැටලීම් සිදුකළ අතර ඒ අනුව සාර්ථක වෙළඳපළ වැටලීම් 25,287ක් සිදුකරන ලදී. එමගින් රුපියල් මිලියන 84.7ක රාජ්‍ය ආදායමක්ද ඉපයීමට හැකිවිය.

මෙම ජයග්‍රහන ලබා ගැනීමට සහාය දුන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට හා කාර්යය මණ්ඩලයට මාගේ කෘතඥ පූර්වක ස්තූතිය පලකරමි.

එමෙන්ම අපගේ තීන්දු තීරණ නිවැරදි මාවතට යොමුකරමින් ඒවා අනුමත කිරීමෙන්ද, නොයෙක් අයුරින් උපදෙස් ලබාදී රාජකාරීන් ඉටු කිරීමට අප ධෛර්යයට පත්කළ අමාත්‍යාංශ ලේකම්තුමාට සහ ගරු ඇමතිතුමාටද මාගේ හෘදයාංගම ස්තූතිය පල කරමි.

අවසන් වශයෙන් අපගේ ක්‍රියාවලීන්ගෙන් තෘප්තිමත් වී ප්‍රශංසාත්මක ලිපි හා ඇගයීම් ලිපි එවූ සියළුම පැමිණිලිකරුවන්ට/පාරිභෝගිකයින්ටද මාගේ ස්තූතිය මෙයින් පුද කරමි.

ආචාර්ය ආර්. එම්. කේ. රත්නායක
සභාපති

දැක්ම

සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ මනාව සුරක්ෂිත වූ පාරිභෝගිකයෙකු බිහි කිරීම

මෙහෙවර

පාරිභෝගික සවිබල ගැන්වීම, වෙළෙඳාම විධිමත් කිරීම සහ යහපත් තරඟකාරීත්ව ප්‍රවර්ධනය කිරීම තුළින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම

# ඒකාබද්ධ ඉලක්කයන්

- පාරිභෝගිකයා වඩාත් තෘප්තියට පත්වන අයුරින් වෙළඳපොල නියාමනය කිරීම
- අසාධාරණ වෙළෙඳ චර්යාවන්ගෙන් පීඩාවට පත් පාරිභෝගිකයන්ට සහන සැලසීම
- පාරිභෝගික අධ්‍යාපනය සහ පාරිභෝගිකයා සවි බල ගැන්වීම
- තරඟ විරෝධී වෙළෙඳ චර්යාවන්ගෙන් නිෂ්පාදකයා හා වෙළෙඳුන් ආරක්ෂා කිරීම සහ වඩාත් හිතකර තරඟකාරී වාතාවරණයක් ප්‍රවර්ධනය කිරීම
- හැකියාවන් වැඩි දියුණු කිරීම තුළින් ආයතනික සංවර්ධනය ළඟා කර ගැනීම

# ආයතනික සාරධර්ම

- **විශ්වාසදායි බව**

  කාර්යසාධන අනුකූලතාව පවත්වා ගැනීම සහ විශ්වාසනීයත්වය තහවුරු කිරීම

- **අවංකත්වය සහ ඒකීයත්වය**

  සියළුම කාර්යයන්හිදී අවංකවීම, සාධාරණ වීම සහ යුක්ති ගරුක වීම

- **වග කිවයුතු බව**

  විනිවිද භාවය ආරක්ෂා කිරීම, වග කිවයුතු බව සහ ඉටු කරනු ලබන සියළුම කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දැරීම

- **කණ්ඩායම් හැඟීම**

  අන්‍යෝන්‍යය අවබෝධය, එකිනෙකාට ගෞරව කිරීම සහ එකිනෙකා අතර විශ්වාසය ගොඩ නැංවීම සහ මනා සන්නිවේදනය සහ නම්‍යශීලිබව වර්ධනය කරමින් පොදු ඉලක්කයන් ළඟාකර ගැනීම උදෙසා සියළුම සේවකයන් එක්ව කටයුතු කිරීම

- **පිළිගැනීම**

  සේවකයින්ගේ විශිෂ්ඨ කාර්යඵල අගය කිරීම හා ප්‍රශංසා කිරීම

- **කැපවීම**

  පවරා ඇති කාර්යයන් කැපවීමෙන් යුක්තව ඉටු කිරීම

- **ප්‍රතිචාර දැක්වීම**

  සේවා සැලසීම සඳහා කැමැත්තක් දැක්වීම සහ සූදානම්වීම

- **නිර්මාණශීලී බව සහ නව්‍යතාවයන් දිරි ගැන්වීම**

  සියළුම ක්ෂේත්‍රයන් අඛණ්ඩව වැඩි දියුණු කිරීම සඳහ නව අදහස් උත්පාදනය කිරීම

1 වන සහ 2 වන මහළ
සතොස මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල
අංක 27, වොක්ෂෝල් වීදිය
කොළඹ 02
26.05.2015

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,

ගරු ඇමතිතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර 2013 වසර සඳහා වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද ශේෂපත්‍රය, ආදායම් සහ වියදම් ගිණුම් සහ විගණකාධිපතිවරයාගේ වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට ,

විශ්වාසී,

ආචාර්ය ආර්. එම්. කේ. රත්නායක
සභාපති
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

වාර්ෂික වාර්තාව -2013

පටුන


| පටුන | පිටුව |
|---|---|
| 1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිළිබඳ හැඳින්වීම | |
| 1.1 හැඳින්වීම - - - - - - - - - | 08 |
| 1.2 අධිකාරියේ ව්‍යවස්ථාව - - - - - - - | 08-09 |
| 1.3 අධිකාරියේ කාර්ය මණ්ඩලය - - - - - - - | 10 |
| 1.4 පාරිභෝගික කටයුතු සභාව - - - - - - - | 10 |
| 2. අධිකාරියේ අභිමතාර්ථ - - - - - - - - | 11 |
| 3. අධිකාරියේ කාර්යභාරය - - - - - - - - | 12-13 |
| 4. 2013 වසර සඳහා පාරිභෝගික කටයුතු අධිකාරියේ/පාරිභෝගික කටයුතු සභාවේ කාර්යසාධනය - | 14-34 |
| 5. 2013 දෙසැම්බර් 31 වන දින වන විට පැවති මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - - | 35-36 |
| 6. 2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව සවිස්තරාත්මක වාර්තාව - - - - - - - - - - | 37 |
| 7. 2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය - - | 38-45 |
| 8. 2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව - | 46-53 |
| 9. විගණකාධිපතිවරයාගේ වාර්තාව සම්බන්ධයෙන් සභාපතිතුමාගේ අදහස් - - - | 54-61 |

## අධිකාරිය පිළිබඳ හැඳින්වීම

### 1.1 හැඳින්වීම

1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත සහ 1987 අංක 1 දරණ සාධාරණ මිල කොමිසම් පනත ද, 1950 මිල පාලන පනත ද අහෝසි කරමින් සම්මත කර ගන්නා ලද 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු අධිකාරිය පනත මගින් පාරිභෝගික කටයුතු අධිකාරිය ඇති කර තිබේ.

මෙම පනතේ පූර්විකාවේ සඳහන් කර ඇති පරිදි පාරිභෝගික කටයුතු අධිකාරියේ මූලික අභිමතාර්ථය වන්නේ වෙළඳාම සහ භාණ්ඩ හා සේවාවන්හි මිල නියාමනය කිරීම තුළින් පාරිභෝගිකයින්ට වඩාත් හොඳ ආරක්ෂාවක් සලසා දීම සහ අසාධාරණ වෙළඳ පරිචයන්ගෙන් සහ සීමා ඇති කරවන වෙළඳ පරිචයන්ගෙන් වෙළඳුන් සහ නිෂ්පාදකයන් ආරක්ෂා කර ගැනීමයි. තවද, හැකි සෑම අවස්ථාවකදීම තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම මෙන් ම, භාණ්ඩ හා සේවා අලෙවිකරුවන් සහ නිෂ්පාදකයින් අතර යහපත් තරඟකාරීත්වයක් ඇති බව සහතික කරගැනීමට සිදු කරනු ඇතැයි මෙහිදී අපේක්ෂා කෙරේ.

### 1.2 අධිකාරියේ ව්‍යවස්ථාව

පනතේ සලසා ඇති විධිවිධාන ප්‍රකාරව අධිකාරිය සභාපතිවරයෙකුගෙන් සහ, පනතේ නියම කර ඇති සුදුසුකම් සහ අත්දැකීම් සහිත පුද්ගලයින් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයින් 10කට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වේ.

#### 2013 වසරේදී අධිකාරියේ සාමාජිකයින්

2013 වසර අවසාන වන විට අධිකාරියේ සාමාජිකයින් වශයෙන් සිටි පුද්ගලයින්ගේ නම් පහත පරිදි වේ:

| | |
|---|---|
| රූමි මර්සුක් මහතා | සභාපති |
| මිල්ටන් අමරසිංහ මහතා | පූර්ණ කාලීන සාමාජික |
| සුනිල් ජයවීර මහතා | පූර්ණ කාලීන සාමාජික |
| මේජර් ජනරාල් නිමල් ඒ ජයසූරිය | පූර්ණ කාලීන සාමාජික |
| මේජර් ජනරාල් පී. චන්ද්‍රවංශ | සාමාජික |
| පූජ්‍ය රැකව ජිනරතන හිමි | සාමාජික |
| ජයන්තිපුර විමලවංශ හිමි | සාමාජික |
| චන්ද්‍රා ඒකනායක මහත්මිය | මහා භාණ්ඩාගාර නියෝජිතවරිය |
| සුගත් මොහාන් ෆ්‍රෑන්ක් ද සිල්වා මහතා | සාමාජික |
| දූෂාන් සෝසා මහතා | සාමාජික |

| | |
|---|---|
| විනෝද් දනසිංගානී මහතා | සාමාජික |
| ජේ. එම්. ජයතිලක ජයසුන්දර මහතා | සාමාජික |
| වරුණ අලව්ව මහතා | සාමාජික |
| අනුර ප්‍රනාන්දු මහතා | සාමාජික |
| අනිල් කුමාර සේනාධීර මහතා | සාමාජික |
| එච්. එල්. එම්. එච්. බණ්ඩාර හේරත් මහතා | සාමාජික |
| බැසිල් වැන්ලැන්ගන්බර්ග් මහතා | සාමාජික |
| ඩබ්ලිව්. ඒ.සී. හේමකුමාර මහතා | සාමාජික |
| ආර්. බී. තෙන්නකෝන් මහතා | සාමාජික |
| මේජර් වයි එච් පී එන් වයි සේනාධිපති | සාමාජික |
| එම් බී එම් ඉබ්‍රහිම් මහතා | සාමාජික |
| මාධව සංජීව වත්තේගම මහතා | සාමාජික |
| වෛද්‍ය ජයන්ත බලවර්ධන | සාමාජික |
| එම්. එච්. එෆ්. ෂෙරිෆ් මහතා | සාමාජික |
| පින්සිත් අමිල පෙරේරා මහතා | සාමාජික |

එම්. එන්. පී. ගුණරත්න මහත්මිය 2012.10.17 වන දින සිට අමාත්‍යාංශ නියෝජිත

| | |
|---|---|
| කේ. ඩී. ඩී. කේ ද ආබෘ මහතා | සාමාජික |
| ඒ. එම්. විජේරත්න අධිකාරි මහතා | සාමාජික |
| එම්. ඒ. විමලවීර මහතා | සාමාජික |
| ඩී සී ක්‍රිස්ටි ජයසේකර මහතා | සාමාජික |
| ආචාර්ය පී තල්ගස්වත්ත මහත්මිය | සාමාජික |
| ආචාර්ය ඩී එස් ජයවීර | සාමාජික |
| ඩබ්ලිව්. සුධම්මික වීරමන් මහතා | සාමාජික |
| සමන් සංජීව පතිරණ මහතා | සාමාජික |
| ටී ජී ජී ධර්මවර්ධන මහතා | සාමාජික |
| ආචාර්ය ටී බී ආනන්ද ජයලාල් | සාමාජික |
| කේ ඒ ඩී ආර් ක්‍රිස්ටි මහතා | සාමාජික |
| ජී කේ ජී එල් එස් බී ජයවර්ධන මහතා | සාමාජික |
| වෛද්‍ය ලක්ෂ්මි සෝමතුංග | සාමාජික |

## 1.3 අධිකාරියේ කාර්ය මණ්ඩලය

රූමි මර්සුක් මහතා 2013 වසරේදී ද අඛණ්ඩව සභාපති වශයෙන් කටයුතු කළේය. 2012 දෙසැම්බර් 3 වන දින සිට බලපෑ වැත්වෙන පරිදි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ජේ. එම්. ඒ. ඩග්ලස් මහතා (ශ්‍රී ලංකා පරිපාලන සේවය - 1 පන්තිය) පත් කරන ලදී.

2013 වසරේදී අධිකාරියෙහි අංශ ප්‍රධානීන්

| # | ණාම | තනතුර |
|---|---|---|
| 01 | දීප්ති තිසේරා මහත්මිය<br><br>M.PA [PIM-Sri J] – නීතිඥ | අධ්‍යක්ෂිකා<br><br>අනුකූලවීම් සහ බලගැන්වීම් |
| 02 | චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය<br><br>B.Sc Agri (Sp) M.Sc (Mgmt) | අධ්‍යක්ෂිකා<br><br>පාරිභෝගික කටයුතු සහ තොරතුරු |
| 03 | ශාන්තිනී තිරුනීලකන්දන් මහත්මිය<br><br>[ACEA] | අධ්‍යක්ෂිකා<br><br>තරඟකාරීත්ව ප්‍රවර්ධන |
| 04 | ඩබ්. එම්. ප්‍රියන්ත මහතා<br><br>MPM B.Com (Sp) Hons, AIPFM, DPFM | අධ්‍යක්ෂ<br><br>මුදල් |
| 05 | සම්පත් අඟුලුගහ මහතා<br><br>B. Com (Sp) Hons, AIPM(SL). Dip in PM | අධ්‍යක්ෂ<br><br>මානව සම්පත් හා පරිපාලන |
| 06 | රොහාන් මීවනගේ මහතා මෙම කාලය තුළදී අඛණ්ඩව අධ්‍යක්ෂ - මිලකිරීම් සහ කළමනාකරණ තනතුරේ රාජකාරි කළේය. | |

## 1.4 පාරිභෝගික කටයුතු සභාව

පනතේ 4 වන කොටසට අනුකූල වීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය පිහිටුවා තිබේ. ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා විසින් 2013.05.20 වන දින සිට බලපැවැත්වෙන පරිදි එහි සභාපති වශයෙන් උපාලි සේනාරත්න මහතා පත් කරන ලද අතර ඒ මහතා 2013 වසර මුළුල්ලේ පාරිභෝගික කටයුතු සභාවේ සභාපති වශයෙන් කටයුතු කරන ලදී.

පාරිභෝගික කටයුතු අධිකාරියේ සාමාජිකයෝ:

උපාලි සේනාරත්න මහතා (නීතිඥ) - සභාපති

වසන්ත ගුණවර්ධන මහතා - සාමාජික

සුදත් විජේවික්‍රම මහතා - සාමාජික

සභාවේ ලේකම්

ලේඛා ආර්යරත්න මහත්මිය (නීතිඥ)

## *2.* අධිකාරියේ අභිමතාර්ථ

a. භාණ්ඩ අලෙවිකරණයේදි හෝ සේවාවන් ලබා දීමේදී පාරිභෝගිකයින්ගේ ජීවිත සහ දේපල වලට උපද්‍රව පැමිණවිය හැකි ආකාරයේ තත්ත්වයන්ගෙන් පාරිභෝගිකයන් ආරක්ෂා කර ගැනීමට

b. අසාධාරණ වෙළඳ චර්යාවන්ගෙන් පාරිභෝගිකයා ආරක්ෂා කර ගනිමින් පාරිභෝගික යහපත කෙරෙහි නිසි අවබෝධය යොමු කෙරෙන බව සහතික කිරීමට

c. හැකි සෑම අවස්ථාවකදීම තරඟකාරී මිල ගණන් යටතේ භාණ්ඩ හා සේවාවන් ලබා ගැනීම සඳහා පාරිභෝගිකයින්ට ප්‍රමාණවත් ප්‍රවේශයක් පවතින බව සහතික කරගැනීමට

d. අසාධාරණ වෙළඳ චර්යාවන්, සීමා ඇති කරවන සුළු වෙළඳ චර්යාවන් හෝ පාරිභෝගිකයින් සූරාකෑම සඳහා වෙළඳුන් වශයෙන් භාවිතා කරන වෙන යම් ක්‍රමයන්ට එරෙහිව සහන ඉල්ලා සිටීමට

## *3.* අධිකාරියේ කාර්යභාරය

1) පහත දක්වෙන කරුණු පාලනය කිරීම හෝ තුරන් කිරීම

   a. ව්‍යවසායයන් අතර ඇතිවන බාධාකාරී වෙළඳ ගිවිසුම්
   b. මිල සම්බන්ධයෙන් ව්‍යවසායන් අතර ඇති වන යම් යම් විධිවිධාන
   c. වෙළඳපොල තුළ වෙළඳපොලේ සැලකිය යුතු අංශයක් තුළ දේශීය වෙළඳාම හෝ ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් තමන්ට ඇති ප්‍රමුඛස්ථානය අයුතු ලෙස භාවිතා කිරීම ; හෝ
   d. දේශීය හෝ ජාත්‍යන්තර වෙළඳාම හෝ ආර්ථික සංවර්ධනයට විනාශකාරී අන්දමෙන් බලපාන්නා වූ බාධක හෝ තරඟකාරිත්වය

2) තරඟකාරිත්ව විරෝධී චර්යාවන් සහ ප්‍රමුඛ ස්ථානය අයුතු ලෙස භාවිතා කිරීම් සම්බන්ධ සිදුවීම් පිළිබඳව විමර්ශනය කිරීම හෝ සොයා බැලීම

3) භාණ්ඩ හෝ සේවාවන් සපයන පුද්ගලයින් අතරේ සඵලදායී තරඟකාරීත්වයක් පවත්වා ගෙන යාම හා එය ප්‍රවර්ධනය කිරීම

4) මිල, භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමට ඇති හැකියාව සහ ඒවායේ සමානභාව මෙන්ම සපයනු ලබන වර්ග යනාදිය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්, මිලදී ගන්නන් සහ භාණ්ඩ හා සේවා භාවිතා කරන අනෙකුත් පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සහ සුභසෙත ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම

5) අලෙවියට ඇති භාණ්ඩ හා සේවාවන්ගේ ගුණාත්මකබව, ප්‍රමාණය, ප්‍රබලත්වය, පවිත්‍රතාව, තත්ත්වය සහ මිල පිළිබඳව පාරිභෝගිකයින් දැනුවත් කිරීම

6) මෙම පනත යටතේ දක්වා ඇති ඕනෑම කාරණයක් හා සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ සිදු කිරීම

7) තරඟකාරිත්වය ප්‍රබල නොවන අවස්ථාවන්හිදී වෙළඳපලේ මිල තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම

8) වෙළඳපල තත්ත්වයන් සහ පාරිභෝගික කටයුතු සම්බන්ධයෙන් අධ්‍යයනය සිදු කිරීමට භාර ගැනීම, වාර්තා ප්‍රකාශනය කිරීම සහ මහජනතාවට තොරතුරු ලබා්ම

9) රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ කාර්යක්ෂම අධ්‍යයන සිදු කිරීමට භාර ගැනීම

10) පාරිභෝගිකයින්ගේ මනා සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුරක්ෂිතබව සම්බන්ධයෙන පාරිභෝගික දැනුවත්භාවය ප්‍රවර්ධනය

11) වෙළඳපොල තත්ත්ව සහ පාරිභෝගික කටයුතු සම්බන්ධයෙන් දෙන තොරතුරු අනෙකුත් ආයතන සමගින් හුවමාරු කරගැනීම ප්‍රවර්ධනය කිරීම

12) පාරිභෝගික සංවිධාන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම, ඒ සඳහා සහාය දීම සහ එයට දිරිගැන්වීම

13) අධිකාරිය විසින් ලබා දෙන යම් සේවාවන් සඳහා අදාල ගාස්තු අය කර ගැනීම

14) අධිකාරියේ කාර්යභාරය ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස අවශ්‍ය වන කම්ටු වෙත ඒවා පත් කිරීම ; සහ

15) අධිකාරියේ අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට සහ අධිකාරියට නියම කර ඇති කාර්යභාරය සඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය කෙරෙන ක්‍රියාවන් වෙත එම ක්‍රියාවන් නිසි පරිදි ඉෂ්ඨ කිරීම

# 4. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්ය සාධනය

සංවිධාන ව්‍යුහයට අනුව අධ්‍යක්ෂවරුන් හය දෙනා සහ අභ්‍යන්තර විගණන අංශය යටතේ ක්‍රියාත්මක වන මූලික අංශ හයකින් අධිකාරිය සමන්විත වේ. ඒවා නම්:

1) පාරිභෝගික කටයුතු සහ තොරතුරු අංශය
2) අනුකූලතා සහ බලාත්මක කිරීමේ අංශය
3) මිල සහ කළමනාකරණ අංශය
4) තරඟකාරිත්ව ප්‍රවර්ධන අංශය
5) මුදල් අංශය
6) මානව සම්පත් සහ පරිපාලන අංශය
7) අභ්‍යන්තර විගණන අංශය

2013 වසරේදී පාරිභෝගික කටයුතු අධිකාරියේ කාර්යසාධනය පහතින් ඉදිරිපත් කර තිබේ.

**1. හානිකර සහ බාල තත්ත්වයේ භාණ්ඩ හා සේවාවන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම**

a. පනතේ 10 වන සහ 12 වන වගන්ති යටතේ නිකුත් කරන ලද නියෝග

i. **නියෝග අංක 45** : හඳුන්කූරු නිෂ්පාදකයින්, ආනයනය කරන්නන් සහ අලෙවිකරුවන් මෙම නියෝගය යටතේ නියම කර ඇති විස්තර පැහැදිලිව සටහන් කළ යුතු වේ.

ii. **නියෝග අංක 46** :මෙම නියෝගය යටතේ නියම කර ඇති දේශීය වශයෙන් නිෂ්පාදිත විදුලි කේබල් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් නිකුත් කරන ලබන එස් එල් එස් නිෂ්පාදන සහතික සලකුණ නොමැතිව තොග හෝ සිල්ලර වශයෙන් නිෂ්පාදනය කිරීමෙන්, බෙදා හැරීමෙන්, ගබඩා කිරීමෙන් හෝ අලෙවි කිරීමෙන් හෝ අලෙවිය සඳහා ප්‍රදර්ශනය කිරීමෙන් හෝ අලෙවිය සඳහා නිරාවරණය කිරීමෙන් හෝ අලෙවිය සඳහා ඉදිරිපත් කිරීමෙන් වැළකීමට නිෂ්පාදකයින්, බෙදා හරින්නන් සහ වෙළඳුන් කටයුතු කළ යුතු වේ.

iii. **නියෝග අංක** 47- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන එස් එල් එස් නිෂ්පාදන සහතික කිරීමේ ලකුණ අදාල ඇසුරුමේ පැහැදිලිව පෙනෙන අන්දමින් සහ කියවිය හැකි අකුරින් මුද්‍රණය කර ඇත්තේ නම් මිස දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන මදුරු කොයිල් හෝ මදුරු මැට් වර්ග තොග හෝ සිල්ලර වශයෙන් නිපදවීම, බෙදා හැරීම, ගබඩා කිරීම හෝ අලෙවි කිරීම හෝ අලෙවිය සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අලෙවිය සඳහා නිරාවරණය කිරීම හෝ අලෙවිය සඳහා ඉදිරිපත් කිරීමෙන් වැලකී සිටීමට නිෂ්පාදකයින්, බෙදා හරින්නන් හෝ වෙළඳුන් විසින් කටයුතු කළ යුතු වේ.

iv. **නියෝග අංක 48** - බඩු ගබඩාව, ස්ටෝරුව හෝ ගබඩා කර ඇති ස්ථානය පාරිභෝගික කටයුතු අධිකාරියේ ලියාපදිංචි කර ඇත්නම් මිස, කිසිම බඩු ගබඩාවක, ස්ටෝරුවක සහ හෝ වෙනත් ස්ථානයක පැකට් වශයෙන් හෝ තොග වශයෙන් කිරිපිටි ගබඩා කර තැබීමෙන් සහ එක් රැස් කර පවත්වාගෙන යාමෙන් කිරිපිටි නිෂ්පාදන ආනයනකරුවන්, නිෂ්පාදකයින් හෝ බෙදා හරින්නන් වැළකිය යුතු වේ.

b. පනතේ 20 (5) වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග

i. **නියෝග අංක 24** - කුකුල්මස් සඳහා උපරිම සිල්ලර මිල නියම කිරීම

c. **ආනයනය කරන ලද බාල තත්ත්වයේ භාණ්ඩ අධීක්ෂණය**

බාල තත්ත්වයේ භාණ්ඩ රටට ඇතුල්වීම ඒවා රටට ඇතුල් වන ස්ථානයේදීම වළක්වාගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා රේගුව සමගින් සම්බන්ධීකරණය කිරීමට කටයුතු කර තිබේ. ආනයන පරීක්ෂා කිරීමේ පරිපාටිය යටතේ සම්මතයන්ට අනුකූල නොවීම හේතුවෙන් භාණ්ඩ යළි අපනයනය කළ යුතු බවට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිර්දේශ කරනු ලැබූ එවන් සිදුවීම් 207ක් අධීක්ෂණය කරන ලදී.

d. ජාතික මට්ටමේ කමිටු සඳහා අධිකාරියේ නියෝජනය ලබා දෙන ලද අතර පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති / නීති හඳුන්වාදීම සඳහා දායකත්වය සපයන ලදී.

සෞඛ්‍ය අමාත්‍යාංශය, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, බලශක්ති අමාත්‍යාංශය සහ ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික සභාව යනාදී ආයතන යටතේ මෙහෙයවෙන ජාතික මට්ටමේ කමිටු තුළ පාරිභෝගික කටයුතු අධිකාරිය තම නියෝජනය ලබා දෙන අතර එතුලින් පාරිභෝගිකයින් ආරක්ෂාව සඳහා නව ප්‍රතිපත්ති සහ නීති හඳුන්වාදීමේදී ඊට දායකත්වය සපයා තිබේ.

**2. කූට ක්‍රියාවන්ගෙන් සහ අසාධාරණ වෙළඳ පරිචයන්ගෙන් පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීම**

a. ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන්

සිවිල් සමාජය අරමුණු කරගෙන සිදු කරන වැඩසටහන් සමගින් දැනුවත්භාවය වර්ධනය කිරීම හරහා අවදානම් පාත්‍ර කණ්ඩායම් ආරක්ෂා කිරීම, වඩාත් ඉහළ තත්ත්වයකට ගෙන ඒම සහ බලගැන්වීම, තරඟකාරිත්වය ප්‍රවර්ධනය සඳහා වන වඩාත් ප්‍රබල ක්‍රමවේදයකි. සැලසුම් කරන ලද සහ සම්පාදනය කරන ලද වෙළඳුන් දැනුවත් කිරීමේ වැඩසටහන හරහා මෙය ක්‍රියාවට නංවා තිබේ.

2013 වර්ෂය තුළදී ව්‍යාපාරික ප්‍රජාව අරමුණු කරගෙන අධිකාරිය විසින් වැඩසටහන් එකසිය අනූ දෙකක් (192) ක්‍රියාත්මක කර තිබේ.

වගුව 1 - 2013 වසරේදී සිදු කරන ලද වෙළෙඳුන් දැනුවත් කිරීමේ වැඩසටහන

| දිස්ත්‍රික්කය | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිවූවන් සංඛ්‍යාව |
|---|---|---|
| අම්පාර | 04 | 72 |
| අනුරාධපුරය | 10 | 236 |
| බදුල්ල | 02 | 95 |
| මඩකලපුව | 03 | 138 |
| කොළඹ | 21 | 2157 |
| ගාල්ල | 04 | 223 |
| ගම්පහ | 07 | 337 |
| හම්බන්තොට | 05 | 107 |
| යාපනය | 01 | 18 |
| කළුතර | 03 | 187 |
| මහනුවර | 24 | 765 |
| කෑගල්ල | 10 | 328 |
| කුරුණෑගල | 14 | 489 |
| මාතලේ | 10 | 277 |
| මාතර | 08 | 666 |
| මොණරාගල | 05 | 279 |
| නුවරඑළිය | 10 | 341 |
| පොළොන්නරුව | 08 | 206 |
| පුත්තලම | 18 | 628 |
| රත්නපුරය | 08 | 149 |
| ත්‍රිකුණාමලය | 11 | 515 |
| වවුනියාව | 06 | 133 |
| මුළු ගණන | **192** | **8,346** |




අනුරාධපුර ඔයාමඩුවේ පවත්වන ලද දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන



අනුරාධපුර ඔයාමඩුවේ පවත්වන ලද දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන



කොළඹ දිස්ත්‍රික්කයේ කාන්තා සංවිධානවල සාමාජිකයන් වෙනුවෙන් පවත්වන ලද වැඩමුළුව



පාසල් දරුවන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන



පාසල් දරුවන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන




ජංගම දැනුවත්කිරීම

b. වෙළඳපල ආවේක්ෂණය

යම්කිසි භාණ්ඩයක් හෝ සේවාවක් ප්‍රජාවේ හෝ එහි කොටසක ජන ජීවිතයට අත්‍යවශ්‍ය වන බව ගරු අමාත්‍යවරයාගේ විශ්වාසය වන්නේ නම්, අධිකාරියේද උපදෙස් ලබාගෙන රජයේ ගැසට්පත්‍රයේ පළ කර එකී භාණ්ඩය හෝ සේවාව විශේෂිත භාණ්ඩ හෝ සේවාවන් වශයෙන් නම් කිරීමට අමාත්‍යවරයාට හැකි වේ.

පහත දැක්වෙන භාණ්ඩ විශේෂ භාණ්ඩ වශයෙන් ලැයිස්තුගත කර තිබේ.

i. සිමෙන්ති
ii. එල්පී ගෑස්
iii. කිරිපිටි
iv. සහල්
v. කුකුලු මස්
vi. තිරිඟු පිටි
vii. සුදුසීනි
viii. වියලි මිරිස්
ix. ලොකු ළූණු
x. රතු ළූණු
xi. පරිප්පු
xii. වියළි හාල්මැස්සන්
xiii. කඩල
xiv. මුං ඇට
xv. ටිං මාලු

මිල අධීක්ෂණය කිරීමේ අරමුණ ඇතිව, සිමෙන්ති, එල්පී ගෑස්, කිරි පිටි, කුකුළු මස් සහ සහල් යන භාණ්ඩ සම්බන්ධයෙන් කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල නිරන්තරයෙන්ම ආවේක්ෂණ කටයුතු සිදු කරන ලදී.

c. වෙළඳපල වැටලීම් සහ විමර්ශන

ලේබල් කිරීම පිළිබඳ ලබා දී ඇති උපදෙස් උල්ලංඝනය කිරීම, සටහන් කර ඇති මිලට වඩා ඉහළ මිලකට භාණ්ඩ විකිණීම, භාණ්ඩ අලෙවි කිරීමට ප්‍රතික්ෂේප කිරීම, තමන් සතුව භාණ්ඩ ඇති බව පිළිනොගැනීම, භාණ්ඩ සඟවා තැබීම, අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීමකින් තොරව ඇතැම් භාණ්ඩයන් හි තොග හෝ සිල්ලර මිල ඉහළ දැමීම, මෙම භාණ්ඩ මිල ගණන් ලැයිස්තුව ප්‍රදර්ශනය නොකිරීම, භාණ්ඩ මිල දී ගන්නන්ට ලදුපත් නිකුත් නොකිරීම, රැවටීම සහගත හෝ කූට ක්‍රියාවන් සහ නිෂ්පාදකයින් / වෙළඳුන් විසින් සිදු කරන ව්‍යාජ නිදේශනය වැළැක්වීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය පනතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව වැටලීම් සිදු කරනු ලැබේ. වැරදි කරනු ලබන වෙළඳුන් අදාල මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියට පමුණුවා නඩු පවරනු ලබන අතර, පනතේ අංක 60 දරන වගන්තිය යටතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව ඔවුන්ට දඩ නියම කරනු ලැබේ.

පසුගිය වර්ෂය තුළදී අධිකාරිය විසින් වෙළඳපල වැටලීම් 25,287 ක් සිදු කර ඇති අතර පාරිභෝගික කටයුතු අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව සහ දිස්ත්‍රික් ඒකක වලට අනුයුක්තව සේවය කරන විවිධ නිලධාරීන් විසින් මෙකී වැටලීම් සිදු කර තිබේ. 2013 වසර තුළදී පනතේ විවිධ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වරදකරුවන් වූ වෙළඳුන්ට අධිකරණ මගින් නියම කර ඇති දඩ මුදල්වල මුළු වටිනාකම රුපියල් මිලියන 84.7 ක් වේ.

සිදුකරන ලද වෙළඳපල වැටලීම් සහ අධිකරණ මගින් නියම කරන ලද දඩ මුදල් සම්බන්ධයෙන් වන ප්‍රගතිය පහත 2 වගුවෙන් දක්වා තිබේ.

## 2 වගුව - වෙළඳපල වැටලීම් සහ නියම කරන ලද දඩ මුදල් සම්බන්ධයෙන් ප්‍රගතිය


| සිදුකරන ක්‍රියාකාරකම් (ඉලක්කය) | සිදුකරන ලද වැටලීම් සංඛ්‍යාව | නඩු සංඛ්‍යාව | නියම කරන ලද දඩ (රුපියල්) |
|---|---|---|---|
| වෙළඳපල වැටලීම් සහ විමර්ශන<br>අ. 10 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොල විමර්ශන<br>*(පනතේ 10 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග උල්ලංඝනය කිරීම)* | 3,736 | 3,212 | 11,573,941 |
| ආ.11 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොල විමර්ශන<br>*(සලකුණු කර ඇති මිලට වඩා වැඩි මිලකට විකිණීම)* | 2,586 | 2,280 | 8,459,268 |
| ඇ. 12 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොල විමර්ශන<br>*(ප්‍රමිතින්ට අනුකූල නොවීම)* | 173 | 162 | 559,000 |
| ඈ. 15 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොල විමර්ශන | 08 | 07 | 25,500 |
| ඉ. 16 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොල විමර්ශන<br>*(යම් භාණ්ඩයක් තමන් සතුව ඇති බව පිළිනොගැනීම)* | 10 | 05 | 119,500 |
| ඊ. 17 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොල විමර්ශන<br>*(භාණ්ඩ සඟවා තැබීම)* | 01 | - | - |
| උ. 18 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොල විමර්ශන<br>*(උපරිම සිල්ලර මිල විලංගනය කිරීම)* | 08 | 02 | 3,000 |
| ඌ. 20 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොල විමර්ශන | 526 | 483 | 1,665,400 |
| එ. 26 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොල විමර්ශන<br>*(භාණ්ඩ මිල ගණන් ලැයිස්තුව ප්‍රදර්ශනය නොකිරීම)* | 9,130 | 8,845 | 25,414,512 |
| ඒ. 28 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොල විමර්ශන<br>*(මිලදී ගන්නන්ට ලදුපත් නිකුත් නොකිරීම)* | 19 | 18 | 67,500 |
| ඔ. 30 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොල විමර්ශන<br>*(නොමගයවන සුළු හෝ රැවටිලි සහගත හැසිරීම)* | *4,133* | 3,507 | 16,684,450 |

| සිදුකරන ක්‍රියාකාරකම් (ඉලක්කය) | සිදුකරන ලද වැටලීම් සංඛ්‍යාව | නඩු සංඛ්‍යාව | නියම කරන ලද දඩ (රුපියල්) |
|---|---|---|---|
| ඕ. 30 සහ 31 වන වගන්ති යටතේ සිදු කරන වෙළඳපොල විමර්ශන (*රැවටිලි සහගත ක්‍රියා සහ නිදේශනය*) | 2,880 | 2,313 | 9,304,929 |
| ක. 31 වන වගන්තිය යටතේ සිදු කරන වෙළඳපොල විමර්ශන (*නිදේශනය*) | 2,077 | 1,897 | 10,810,700 |
| **එකතුව** | **25,287** | **22,731** | **84,687,700** |

සිදු කරන ලද වැටලීම්වලට අමතරව අධිකරණයේ පවරන ලද නඩු සංඛ්‍යාව 67 ක් වන අතර දඩ වශයෙන් රු. 338,000 ක් එකතු කරගැනීමට අධිකාරිය සමත් වී තිබේ.

2013 වසරේදී පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් සිදුකරන ලද වෙළඳපල වැටලීම්

වැටලීම් සංඛ්‍යාව





මාසය

ජනවාරි පෙබරවාරි මාර්තු අප්‍රේල් මැයි ජුනි ජුලි අගෝස්තු සැප්තැම්බර් ඔක්තෝබර් නොවැම්බර් දෙසැම්බර්

2013 වසරේදී පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් නියම කරන ලද දඩ

දඩය රු




ජනවාරි පෙබරවාරි මාර්තු අප්‍රේල් මැයි ජුනි ජුලි අගෝස්තු සැප්තැම්බර් ඔක්තෝබර් නොවැම්බර්

## 2013 වසරේදී පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් සිදු කරන ලද වෙළඳපොල වැටලීම්

| | |
|---|---|
|  |  |
| වානේ කම්බි සම්බන්ධයෙන් වැටලීම | සුදු සහල් වලට වර්ණක කලවම් කිරීම |
|  |  |
| මිරිස් කුඩු සමගින් රෙදි ඩයි කලවම් කිරීම | කල් ඉකුත් වූ ටින් මාලු ටින් වල කල් ඉකුත් වන දිනය වෙනස් කිරීම සඳහා සූදානම් කර තිබූ තොගයක් සඳහා නිදර්ශනය |
|  |  |
| හිසකෙස් වල ගල්වන සායම් පැකට්ටු වල ව්‍යාජ සහ අව්‍යාජ නිදර්ශන දෙකක් | පලතුරු වලට කාබයිට් ගැසීම |

3. අසාධාරණ පරිචයන්ගෙන් බලපෑමට ලක්වූ පාරිභෝගිකයන්ට සහන සැලසීම

a. පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම

පනතේ අංක 13 සහ 32 යන වගන්ති යටතේ වන විධිවිධාන මත පදනම් වෙමින් පාරිභෝගිකයින් විසින් සිදු කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත්වීමට පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් කටයුතු කරනු ලැබේ. නිෂ්පාදකයා හෝ අලෙවිකරු විසින් ගම්‍යාර්ථයෙන් හෝ වෙන යම් අයුරකින් ලබා දෙන වගකීමට හෝ සහතිකයට අනුකූල නොවන ලෙසින් සිදුවන සේවා සැපයුම සහ භාණ්ඩ අලෙවිය සම්බන්ධයෙන් සිදු කරනු ලබන පැමිණිලි පිලිබඳව විමර්ශන සිදු කිරීමට අධිකාරියට හැකිය.

2013 වර්ෂය තුළදී අධිකාරිය පැමිණිලි 1387 ක් භාර ගෙන ඇති අතර ඉන් පැමිණිලි 565 ක් ම දෙපාර්ශ්වයේම සෑහීමට පත් වන අන්දමෙන් විසඳීමට හැකි වී තිබේ. ලැබුණු පැමිණිලිවලින් 19 ක් දිස්ත්‍රික් ඒකක වලට යොමු කර තිබෙන අතර, පැමිණිලි 427 ක් වෙළඳපොල වැටලීම් සිදු කිරීම සඳහා යොමු කර තිබේ.

2013 වසරේදී පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ලැබූ ප්‍රගතිය පහත 3 හා 4 වගුවලින් ඉදිරිපත් කර තිබේ.

**3 වගුව** - 2013 වර්ෂය තුළදී කටයුතු කළ පැමිණිලි සංඛ්‍යාව

| | |
|---|---|
| ලැබූ පැමිණිලි සංඛ්‍යාව | 1,387 |
| වෙනත් ආයතනවලට යොමු කළ පැමිණිලි * | 129 |
| වෙළඳපල වැටලීම් හෝ වෙනත් ක්‍රියාමාර්ග සඳහා යොමු කළ පැමිණිලි* | 427 |
| අවසන් කල පැමිණිලි * | 565 |
| ප්‍රතික්ෂේප වූ පැමිණිලි * | 37 |
| පවත්වන ලද සාකච්ඡා * | 455 |

*මෙයට පසුගිය වසරේ සිට ඉදිරියට ගෙනා, තවමත් විසඳා නොමැති පැමිණිලි ද ඇතුළත් වේ.

**4 වගුව :** පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන

| ගනු ලැබූ ක්‍රියාමාර්ග | සංඛ්‍යාව |
|---|---|
| පැවැත්වූ විමර්ශන | 137 |
| බේරුම් කරන ලද විමර්ශන | 13 |
| නිකුත් කළ නියෝග | - |
| පැවැත්වූ සාකච්ඡා - විමර්ශනයට පෙර | 49 |

වගඋත්තරකරුවන් විසින් අනුකූල නොවීම හේතුවෙන් නියෝග බලාත්මක කරවාගැනීම සඳහා අධිකාරිය විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති නඩු සංඛ්‍යාව 67 ක් වේ.

4. පාරිභෝගිකයන් දැනුවත් කිරීම සහ බලගැන්වීම
   a. පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන්

පාරිභෝගික අයිතිවාසිකම් සහ වගකීම්, දැනට බලපවත්නා පාරිභෝගික නීතිය, යහපත් පාරිභෝගික සාරධර්ම සහ සාධාරණ ව්‍යාපාර පරිචයන් යනාදිය පිළිබඳව මහජනතාවට දැනුම ලබා දීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත මාධ්‍ය, සම්මන්ත්‍රණ සහ වැඩමුළු, ප්‍රදර්ශන යනාදිය භාවිතා කරනු ලැබේ. ඉහත සඳහන් කළ වැඩ සටහන් වලට අමතරව පාරිභෝගික කන්ඩායම් සහ ව්‍යාපාරික ප්‍රජාවේ සහභාගිත්වය ඇතිව පාරිභෝගික අයිතිවාසිකම් දිනයද සමරනු ලැබේ. පාරිභෝගික අයිතිවාසිකම් සහ පනතේ දක්වා ඇති නීතිරීති හා රෙගුලාසි සම්බන්ධයෙන් දිවයින මුළුල්ලේම පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වඩසටහන් පවත්වන ලදී.

2013 වර්ෂය තුළදී පාරිභෝගික අධිකාරිය විසින් මහජනතාවගේ දැනුවත්භාවය සඳහා පරිභෝගික දැනුවත්කිරීමේ වැඩසටහන් 217 ක් ද පාසල් දරුවන්ගේ දැනුවත්භාවය සඳහා දැනුවත්කිරීමේ වැඩසටහන් 126ක් ද පවත්වා තිබේ. මෙකී වැඩසටහන් පාරිභෝගික කටයුතු අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මගින් මෙන්ම දිස්ත්‍රික් ඒකක මගින් ද පවත්වන ලදී. මෙම වැඩසටහන් වලට අමතරව, මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශන 2කට ද තම දායකත්වය ලබා දීමට පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් කටයුතු කර තිබේ. මහජනතාව වෙනුවෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්, පාරිභෝගික සංවිධාන පිහිටුවීම, පාසල් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්, පාසල් පාරිභෝගික සමාජ පිහිටුවීම, ප්‍රදර්ශන යනාදිය සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රගතිය පහත 5 - 9 දක්වා වගු මගින් පෙන්නුම් කර තිබේ.

5 වගුව - මහජනතාව වෙනුවෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

| දිස්ත්‍රික්කය | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | සාමාජිකයන් සංඛ්‍යාව |
|---|---|---|
| අම්පාර | 07 | 152 |
| අනුරාධපුරය | 08 | 200 |
| බදුල්ල | 08 | 293 |
| මඩකලපුව | 09 | 363 |
| කොළඹ | 37 | 10745 |
| ගාල්ල | 08 | 1425 |
| ගම්පහ | 04 | 375 |
| හම්බන්තොට | 07 | 953 |
| යාපනය | 04 | 117 |
| කළුතර | 07 | 166 |
| මහනුවර | 09 | 641 |
| කෑගල්ල | 12 | 1093 |
| කුරුණෑගල | 15 | 705 |
| මාතලේ | 08 | 303 |
| මාතර | 09 | 275 |
| මොණරාගල | 02 | 428 |
| නුවරඑළිය | 09 | 250 |
| පොළොන්නරුව | 07 | 2706 |
| පුත්තලම | 11 | 1805 |
| රත්නපුරය | 13 | 544 |
| ත්‍රිකුණාමලය | 15 | 365 |
| වවුනියාව | 08 | 188 |
| **එකතුව** | **217** | **24,098** |

**වගුව – 6-**පාරිභෝගික සංවිධාන පිහිටුවීම

| දිස්ත්‍රික්කය | පිහිටුවන ලද සංවිධාන සංඛ්‍යාව | ලියාපදිංචි කරන ලද සංවිධාන සංඛ්‍යාව |
|---|---|---|
| අම්පාර | 01 | 27 |
| මඩකලපුව | 01 | 36 |
| කොළඹ | 03 | 146 |
| රත්නපුරය | 01 | 25 |
| ත්‍රිකුණාමලය | 02 | 66 |
| මාතලේ | 01 | 15 |
| වවුනියාව | 01 | 19 |
| එකතුව | **10** | **334** |

**වගුව – 7 -**පාසල් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

| දිස්ත්‍රික්කය | පවත්වන ලද වැඩසටහන් ගණන | සහභාගිවූවන් සංඛ්‍යාව |
|---|---|---|
| අම්පාර | 12 | 309 |
| අනුරාධපුරය | 02 | 40 |
| බදුල්ල | 03 | 1,348 |
| මඩකලපුව | 14 | 514 |
| කොළඹ | 25 | 3,247 |
| ගාල්ල | 01 | 150 |
| ගම්පහ | 01 | 118 |
| යාපනය | 05 | 214 |
| කළුතර | 04 | 167 |
| මහනුවර | 02 | 275 |
| කෑගල්ල | 10 | 1,672 |

| දිස්ත්‍රික්කය | පවත්වන ලද වැඩසටහන් ගණන | සහභාගිවූවන් සංඛ්‍යාව |
|---|---|---|
| කුරුණෑගල | 09 | 1,216 |
| මාතලේ | 02 | 71 |
| මාතර | 04 | 239 |
| මොණරාගල | 02 | 99 |
| නුවරඑළිය | 01 | 146 |
| පුත්තලම | 14 | 1,711 |
| රත්නපුරය | 05 | 430 |
| ත්‍රිකුණාමලය | 07 | 422 |
| වවුනියාව | 03 | 92 |
| **එකතුව** | **126** | **12,480** |

8 **වගුව** - පාසල් පාරිභෝගික කව පිහිටුවීම

| දිස්ත්‍රික්කය | පිහිටුවනු ලැබූ පාරිභෝගික කව සංඛ්‍යාව | ලියාපදිංචි කරනු ලැබූ පාරිභෝගික කව සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 20 | 2,158 |
| රත්නපුරය | 01 | 165 |
| ත්‍රිකුණාමලය | 08 | 502 |
| වවුනියාව | 02 | 58 |
| **එකතුව** | **31** | **2,883** |

**9 වගුව** - ප්‍රදර්ශන

| **දිස්ත්‍රික්කය** | **ක්‍රියාකාරකම් වර්ගය** | **නැරඹීමට පැමිණි පුද්ගලයින් සංඛ්‍යාව** |
|---|---|---|
| ගාල්ල | ගාමිණි මහා විද්‍යාලය - ගාල්ල | 2000 |
| කොළඹ | අම්පාරේ ඔයාමඩුව ප්‍රදේශයේ පැවැත්වූ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය | 650,000 |
| | **එකතුව** | **652,000** |

## 5. තරඟකාරිත්ව විරෝධී වෙළඳ පරිචයන්ගෙන් අලෙවිකරුවන් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කර ගැනිම සහ යහපත් තරඟකාරීත්වය ප්‍රවර්ධනය

a. තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම

තරඟකාරිත්ව විරෝධී පරිචයන් පිළිබඳව 2013 වසරේදී අධිකාරියට ලැබුණු පැමිණිලි මත පදනම් වෙමින් විමර්ශන 26 ක් පැවැත්වීමට අධිකාරිය විසින් කටයුතු කර ඇති අතර එකී පැමිණිලි අතරින් පැමිණිලි 16ක් මෙම කාලය තුළදී විමර්ශනය කර නිමා කර ඇති අතර, තවත් පැමිණිලි 7 ක් පාරිභෝගික කටයුතු සභාවට යොමු කර තිබේ.

ලැබූ පැමිණිලිවලට අමතරව අභ්‍යාස පොත් වෙළඳපොල තුළ විය හැකි තරඟකාරීත්ව විරෝධී පරිචයන් තිබේ නම් ඒවා හඳුනාගැනීමේ අරමුණින් අධිකාරියේම මුල පිරීමෙන් අධ්‍යයනයක් සිදු කිරීමට ද කටයුතු කර තිබේ.

- එසේම වත්මනෙහි පවතින ගැටළු සහ ඒවා භාණ්ඩවල මිල ගණන් වලට කෙසේ බලපාන්නේද යන්න පිළිබඳව විශේෂ අධ්‍යයනයක් සිදු කරන ලදී. කාර්මික ගෑස් සිලින්ඩර් සහ වෛද්‍ය ගෑස් සිලින්ඩර් මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සහ සිල්ලර වෙළඳපොලට එහි ඇති බලපෑම පිළිබඳව සිදුකරන ලද අධ්‍යයනයද මීට ඇතුළත් වෙයි. අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා නිෂ්පාදන පැතිකඩ සකස් කරන ලදී

- වෙළඳපල කොටස සහ හඳුනාගැනීම සහ සංඛ්‍යානමය දත්ත එක්රැස් කිරීම

වෙළඳපොලේ හෝ වෙළඳපලේ සැලකිය යුතු කොටසක් තුළ අලෙවිය සම්බන්ධයෙන් තමන් දරන ප්‍රමුඛස්ථානය අයුතු ලෙස භාවිතා කිරීම පාලනය කිරීමේ හෝ තුරන් කිරීමේ වගකීම පාරිභෝගික කටයුතු අධිකාරිය සතු වේ. දේශීය වෙළඳපලෙහි දක්නට ඇති තෝරාගත් භාණ්ඩ සම්බන්ධයෙන් එකී ව්‍යාපාරවල වෙළඳපල කොටස හඳුනාගැනීමට සහ තමන්ට ඇති ප්‍රමුඛස්ථානය අයුතු ලෙස භාවිතා කිරීමට ඇති ඉඩකඩ පිළිබඳව හඳුනාගැනීම සඳහා සංඛ්‍යානමය දත්ත එක්රැස් කරන ලදී. එතුලින් එකී අංශ සහ කර්මාන්ත සහ සම්බන්ධයෙන් පවතින වෙළඳපල ව්‍යුහයන් හඳුනාගැනීමට පාරිභෝගික කටයුතු අධිකාරියට හැකි වී තිබේ.

වෙළඳපලේ ආධිපත්‍යය පැතිරවීම පිළිබඳව අධ්‍යයනය කිරීමේ අරමුණින් නිෂ්පාදන 29ක වෙළඳපොල කොටස ගණනය කිරීමට අධිකාරිය විසින් පියවර ගෙන තිබේ. තරඟකාරී නොවන භාණ්ඩ හා සේවාවන් සම්බන්ධයෙන් මෙසේ වෙළඳපොල හඳුනාගැනීමට කටයුතු කිරීම ඉතාමත් අත්‍යවශ්‍ය වේ.

අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ආවේක්ෂණ 18 ක් සිදු කිරීමට අධිකාරිය කටයුතු කර තිබේ. අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අධීක්ෂණය කිරීමේ අරමුණින් කොළඹ සහ අනිකුත් දිස්ත්‍රික්ක වල මිල සංවේක්ෂණ නිරන්තරයෙන්ම සිදු කරනු ලැබේ.

ආහාරද්‍රව්‍ය වල දෛනික වෙළඳපල මිල ගණන් මත පදනම් වෙමින් දෛනික එළවළු හා මාළු මිල ගණන් විශ්ලේෂණ වාර්තාවන් ඉදිරිපත් කරනු ලැබේ. එසේ වාර්තා 556 ක් ඉදිරිපත් කර තිබේ.

b. දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම

හඳුනාගත් ආනයනික භාණ්ඩ සඳහා උපරිම සිල්ලර මිලක් නියම කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලදී. තරඟ වැදීම සඳහා සමාන අවස්ථා ලබා දීමට ඉඩසැලසීම තුලින් දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ. ආනයනය කරන අවස්ථාවේදී ම උපරිම සිල්ලර මිල සඳහන් කිරීම සුදුසු වේ යැයි සලකනු ලබන තෝරා ගත් නිෂ්පාදන කිහිපයක් පිළිබඳව අධිකාරිය විසින් අධීක්ෂණය කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු අධිකාරිය පනතේ 10 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අංක 1505/15 දරණ, 2007.07.11 වන දිනැති ගැසට් නිවේදනය මගින් නියම කර ඇති පරිදි හඳුනාගත් නිෂ්පාදන 5 ක් ආනයනය කරන සියලුම ආනයනකරුවන් විසින් භාණ්ඩ මෙරටට ආනයනය කිරීමට පෙර එකී භාණ්ඩවල මිල සටහන් කිරීම අනිවාර්ය වේ. ඒ අනුව ආනයනකරුවන් විසින් රේගුවෙන් භාණ්ඩ නිදහස් කර ගැනීමට පෙර එකී භාණ්ඩ විකිණීමට අපේක්ෂා කරන උපරිම සිල්ලර මිල සහිත අයදුම්පත් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වන බවට රේගු දෙපාර්තමේන්තුව විසින් නියෝගයක් නිකුත් කර තිබේ.

රසකැවිලි, චොක්ලට්, විස්කෝතු, කේක් සහ සුවඳ සබන් අනයනය කරන ආනයනකරුවන් තම උපරිම සිල්ලර මිල සඳහන් ප්‍රකාශ පාරිභෝගික කටයුතු අධිකාරිය වෙත යොමු කරනු ලැබේ. එසේ ප්‍රකාශ කරනු ලබන උපරිම සිල්ලර මිල පදනම් කරගනිමින් ඒ මත සෙස් බදු පැනවීමට රේගු දෙපාර්තමේන්තුවෙන් කටයුතු කරනු ලැබේ. මෙකී භාණ්ඩ සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කළ මිල ගණන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වන්නේදැයි සහතික කරගැනීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් නිරන්තර වෙළඳපොල පරීක්ෂාවන් සිදු කරනු ලැබේ. අදාල කාලසීමාව තුළ මෙවන් අයදුම්පත් 291 ක් සම්බන්ධයෙන් කටයුතු කර තිබේ.

c. සාධාරණ මිළ සහතික කර ගැනීම

අ. විශේෂිත භාණ්ඩවල මිල නියාමනය

පනතේ 18, 19 සහ 20 දරන වගන්ති මගින් ලබා දී ඇති බලතල මත පදනම් වෙමින් හඳුනාගත් භාණ්ඩ වල වෙළඳපල මිල සම්බන්ධයෙන් මැදිහත්වීමට පාරිභෝගික අධිකාරිය විසින් කටයුතු කරනු ලබයි. එකී තෝරාගත් භාණ්ඩ වල මිල ගණන් ස්ථාවර කිරීමට / ස්ථායී තත්ත්වයට ගෙන ඒමට පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පහත 10 වගුවෙන් ඉදිරිපත් කර තිබේ.

**10** වගුව – විශේෂිත භාණ්ඩවල මිල ස්ථාවර කිරීමට / ස්ථායී තත්ත්වයට ගෙන ඒමට පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

| **භාණ්ඩය** | **ගනු ලැබූ ක්‍රියාමාර්ගය** |
|---|---|
| සිමෙන්ති | සිමෙන්ති සමාගම් විසින් සිදු කරනු ලැබූ ඉල්ලීම් සලකා බලා සිමෙන්ති සන්නම් වර්ග 10 ක උපරිම සිල්ලර මිල ඉහළ නංවා තිබේ. |
| කුකුල් මස් | පනතේ 20 (5) වගන්තිය යටතේ 2013 මැයි මස 20 වන දින ප්‍රකාශයට පත් කළ ගැසට් නිවේදනය හරහා කුකුලු මස් වල උපරිම සිල්ලර මිල සංශෝධනය කර ඇති අතර ඒ අනුව මිල ගණන් පහත පරිදි වේ :<br>• සම සහිත බ්‍රොයිලර් කුකුලු මස් කිලෝග්‍රෑම් 1 ක් (සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන්) - වෙළඳ නාමයක් යටතේ විකුණන විට : මිල රු. 380.00<br>• සම සහිත බ්‍රොයිලර් කුකුලුමස් කිලෝග්‍රෑම් 1 ක් - (සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන්) - වෙළඳ නාමයක් රහිතව විකුණන විට : මිල රු. 370.00 |
| LP ගෑස් | ප්‍රධාන එල් පී ගෑස් සැපයුම්කරුවන් දෙදෙනාට අලෙවිය සඳහා අවසරදී ඇති උපරිම සිල්ලර මිල ගණන් පහත පරිදි වේ.<br>• ලිට්රෝ – 12.5kg සිලින්ඩරය – රු. 2,396/- (කොළඹ)<br>2.3kg සිලින්ඩරය – රු. 470/- (කොළඹ)<br>• ලාෆ්ස්– 12.5kg සිලින්ඩරය – රු.2,396/- (කොළඹ) |

**වෙනත් ක්‍රියාකාරකම්**

| | |
|---|---|
| කිරිපිටි ගබඩා ලියාපදිංචි කිරීම | 2014 දෙසැම්බර් 27 වන දින කිරිපිටි ගබඩා ලියාපදිංචි කිරීම සඳහා ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. |
| ඖෂධ | පාරිභෝගික කටයුතු අධිකාරිය පනතේ 18 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව "ඖෂධ" අත්‍යවශ්‍ය භාණ්ඩයක් ලෙස නිර්දේශ කිරීමේ කටයුත්ත සඳහා මූලික අධ්‍යයනයන් සිදු කරන ලදී. |

d. සංවිධානයේ ශක්‍යතාවය වැඩි දියුණු කිරීම

අ. කාර්ය මණ්ඩලය සංවර්ධනය කිරීම

පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් තම කාර්ය මණ්ඩලය ඔවුන්ට අදාල වන එක් එක් ක්ෂේත්‍රයන් හරහා සංවර්ධනය කිරීම සලකනු ලබන්නේ අපගේ සේවාවන්ගේ ගුණාත්මක භාවය වර්ධනය කිරීමට දායක වන ආයෝජනයක් ලෙස වේ. 2013 වසරේදී කාර්යමණ්ඩලය සඳහා පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් පිලිබඳ විස්තර පහත 12 වගුවෙන් ඉදිරිපත් කර තිබේ.

12 වගුව - 2013 වසරේ පවත්වනු ලැබූ කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්

| අංක | පාඨමාලාවේ නම | සහභාගිවූවන් ගණන |
|---|---|---|
| 01 | "වෙළඳාම සහ ආයෝජනය පෝෂණය කිරීමෙහිලා තරඟකාරිත්වයේ භූමිකාව" පිළිබඳව පවත්වන ලද 3 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | 01 |
| 02 | මූලික සංඛ්‍යානය | 03 |
| 03 | සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවකට හුරුවීම පිළිබඳව රාජ්‍ය අංශයේ ඉහළ හා මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්ගේ ශක්‍යතා වර්ධනය | 02 |
| 04 | Excel භාවිතයෙන් මූල්‍යකරණ ආදර්ශ පිළිබඳව CIMA Master පාඨමාලාව | 01 |
| 05 | මැලේසියාවේ පවත්වන ලද පාරිභෝගික අධ්‍යාපන වැඩසටහන | 01 |
| 06 | කළමනාකරණ සහකරුවන් සංවර්ධනය | 04 |
| 07 | රියදුරන් සහ සුළු සේවකයන් සඳහා පවත්වන ලද නිවැරදි ආකල්ප සහ පෙළඹවීම් පිලිබඳ වැඩසටහන | 02 |
| 08 | හලාල් ප්‍රමිතිය, හලාල් විද්‍යාව සහ තාක්ෂණය සහ හලාල් නිෂ්පාදන අලෙවිය පිළිබඳව පවත්වන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | 01 |
| 09 | ලේඛක කටයුතු පිලිබඳ පරිචයන් | 01 |
| 10 | සඵලදායී අන්තර් පුද්ගල කුසලතා පිළිබඳ සම්මන්ත්‍රණය | 01 |
| 11 | ලේකම්වරුන් සහ පිලිගැනීමේ නිලධාරීන් සඳහා වූ පුහුණුව | 01 |
| 12 | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් පිළිබඳ පැවැත්වූ එක් දින සම්මන්ත්‍රණය | 01 |
| 13 | ඵලදායිත්ව මෙවලමක් ලෙස සුපිරි 5S ක්‍රමය | 01 |

| අංක | පාඨමාලාවේ නම | සහභාගිවූවන් ගණන |
|---|---|---|
| 14 | සේවය අවසන් කරන විට ලැබෙන ප්‍රතිලාභ | 01 |
| 15 | වැටුප් කළමනාකරණය සහ වැටුප් පරිවර්තනය පිලිබඳ පුහුණුව | 02 |
| 16 | බුද්ධිමය දේපල සඳහා ගරුත්වය ඇති කිරීම පිණිස වූ WIPO කලාපීය වැඩමුළුව | 01 |
| 17 | රියදුරන් සඳහා වූ වැඩමුළුව | 04 |
| 18 | විනය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 02 |
| 19 | ආනයන සහ අපනයන කාර්ය පටිපාටිය පිළිබඳව වූ වැඩමුළුව | 01 |
| 20 | ප්‍රවාහන කළමනාකරණය පිළිබඳව වූ වැඩමුළුව | 01 |

ඇ. අධිකාරියේ කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම

| වැටුප් කේතය | තනතුර | 2011.05.19 වන දින වන විට අනුමත සේවක සංඛ්‍යාව | 2013 12 31 දින වන විට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| **HM 2-1** | **ජ්‍යෙෂ්ඨ කළමනාකරු** | | | |
| **HM 1-1** | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| | අධ්‍යක්ෂ | 6 | 5 | 1 |
| | සභාවේ ලේකම් | 1 | 1 | 0 |
| **MM 1-1** | **කළමනාකරු** | | | |
| | අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 15 | 5 | 7 |
| | සහකාර අධ්‍යක්ෂ | | 3 | |
| | නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ / කලාප | 9 | 0 | 9 |
| **JM 1-1** | **කණිෂ්ඨ කළමනාකරු** | | | |
| | විගණන නිලධාරී | 2 | 0 | 2 |
| | පද්ධති පරිපාලක | 1 | 0 | 1 |
| | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | 27 | 15 | 12 |
| | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී | 1 | 0 | 1 |
| | ජ්‍යෙෂ්ඨ වෙළඳපල සම්පත් විශ්ලේෂක | 1 | 0 | 1 |

| වැටුප් කේතය | තනතුර | 2011.05.19 වන දින වන විට අනුමත සේවක සංඛ්‍යාව | 2013 12 31 දින වන විට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| | ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරී | 2 | 1 | 1 |
| | පෞද්ගලික ලේකම් (අධ්‍යක්ෂ ජනරාල් ) | 1 | 0 | 1 |
| | පෞද්ගලික ලේකම් (සභාපති) | 1 | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ පරිපාලන/මානව සම්පත් නිලධාරී | 1 | 0 | 1 |
| | ජ්‍යෙෂ්ඨ නීති සහ බලාත්මක කිරීමේ නිලධාරී | 2 | 2 | 0 |
| | ජ්‍යෙෂ්ඨ පිරිවැයකරණ නිලධාරී | 1 | 0 | 1 |
| **MA 5-2** | **බලාත්මක කිරීම / මෙහෙයුම් / ව්‍යාප්ති** | | | |
| | දත්ත සම්බන්ධීකාරක | 1 | 0 | 1 |
| | සංඛ්‍යාන නිලධාරී | 1 | 1 | 0 |
| | වෙළඳපල සම්පත් විශ්ලේෂක | 1 | 1 | 0 |
| | ලේඛන සම්පාදක නිලධාරී | 6 | 0 | 6 |
| | පුස්තකාලයාධිපති | 1 | 0 | 1 |
| | පිරිවැයකරණ නිලධාරී | 15 | 3 | 10 |
| | ගිණුම් නිලධාරී | | 9 | |
| | පරිපාලන නිලධාරී | 5 | 5 | 0 |
| | නීති හා බලාත්මක කිරීමේ නිලධාරී | 3 | 3 | 0 |
| | විමර්ශන නිලධාරී | 200 | 165 | 35 |
| **MA 2-2** | **කළමනාකරණ සහකාර (තාක්ෂණික)** | | | |
| | පොත් තබන්නා | 1 | 0 | 1 |
| **MA 1-2** | **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)** | | | |
| | කළමනාකරණ සහකාර | 31 | 22 | 9 |
| **PL 3** | **ප්‍රාථමික මට්ටමේ, නිපුණතා සහිත** | | | |
| | රියදුරු | 18 | 17 | 1 |
| **PL 1** | **ප්‍රාථමික මට්ටමේ නිපුණතා රහිත** | | | |
| | කාර්යාල සහායක | 14 | 14 | 0 |
| | **එකතුව** | **370** | **275** | **96** |

ඇ. කාර්ය මණ්ඩලය පෙළඹවීම සහ සුභසාධනය

ප්‍රසන්න සහ සේවය සැපයීමට පහසු කරන වැඩ පරිසරයක් කාර්ය මණ්ඩලය වෙනුවෙන් ලබා දීමේ අරමුණ ඇතිව වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, සංස්කෘතික සහ ආගමික වැඩසටහන්, කාර්ය මණ්ඩල දිරිගැන්වීමේ යෝජනා ක්‍රම, කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්, සේවකයින් පිලිගැනීමට ලක් කිරීමේ වැඩසටහන් යනාදී පියවර ගණනාවක් වසර මුළුල්ලේම පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

ඈ. පාරිභෝගික කටයුතු අධිකාරිය පනතට සිදුකරන ලද සංශෝධන

නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙන් ලැබුණු සංශෝධනවල අවසන් කෙටුම්පත් පිටපත පරීක්ෂා කර ආපසු නිති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යැවීමට නියමිතය.

## පාරිභෝගික කටයුතු සභාව – 2013

පාරිභෝගික කටයුතු සභාව පරිපාලනමය වශයෙන් ක්‍රියාත්මක වන්නේ පාරිභෝගික කටයුතු අධිකාරිය යටතේ වන අතර ප්‍රධාන වශයෙන්ම තරඟකාරීත්ව විරෝධී පරිචයන් යන ක්ෂේත්‍රයට අදාලව අධිකාරිය විසින් එයට යොමු කරන කාරණා විභාග කිරීමටත් තීන්දු ලබාදීමටත් අවශ්‍ය බලය පනත මගින් සභාවට පවරා තිබේ. පනතේ විධිවිධාන ප්‍රකාරව අධික මිල ගණන් අය කිරීම, වෙළඳ පල දෝෂ සහ වෙළඳපල හැසිරවීම යනාදිය සම්බන්ධ සිදුවීම් ද විමර්ශනය සඳහා මෙම සභාව වෙත යොමු කරනු ලැබේ. අවශ්‍ය කරන අවස්ථාවන්හිදී භාණ්ඩ හෝ සේවාවන් ලබා දිය හැකි උපරිම මිල සීමාවන් නිර්දේශ කිරීම සඳහා ද සභාවට බලය ලබා දී තිබේ.

**පැමිණිලි / යොමු කිරීම්**

| පාරිභෝගික කටයුතු අධිකාරිය පනතේ අදාල වගන්තිය | පැමිණිලි / යොමු කිරීම් සංඛ්‍යාව | නිරවුල් කිරීම් / තීන්දු / නිර්දේශ |
|---|---|---|
| 38 වගන්තිය<br><br>තරඟකාරිත්ව විරෝධී පරිචයන් | 6 | 6 |
| 19 වගන්තිය<br><br>භාණ්ඩ හා සේවාවන් සම්බන්ධයෙන් උපරිම මිල සීමාවක් නිර්දේශ කිරීම | 1 | 2 |
| 19 හා 22 වගන්ති<br><br>භාණ්ඩ හා සේවාවන් සඳහා ඉතා ඉහළ මිල ගණන් නියම කිරීම සම්බන්ධයෙන් සිදු කෙරෙන විමර්ශන | 3 | - |

විශේෂ කාර්යයක් වශයෙන් 1977 ව්‍යාපෘතියේ දෛනික කාර්ය භාරය අධීක්ෂණය කිරීම සභාව විසින් සිදු කරනු ලබයි.

- මිල ගණන් පරීක්ෂා කර භාණ්ඩ මිල දර්ශනය යාවත්කාලීන කිරීම
- පාරිභෝගික පැමිණිලි වල සාරාංශය පරීක්ෂා කිරීම
- පද්ධතිය සුමට ලෙසත් පාරිභෝගික මිතුරු අන්දමටත් ක්‍රියාත්මක වන්නේදැයි අධීක්ෂණය කිරීම

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## 2013 දෙසැම්බර් 31 වන දින වන විට පවතින මුල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | 31.12.2013 දිනට<br>රු 000' | 31.12.2012 දිනට<br>රු 000' |
|---|---|---|
| **වත්කම්** | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 10,775 | 9,865 |
| ලැබිය යුතු වෙළඳ හා අනෙකුත් | 21,724 | 18,579 |
| ඉන්වෙන්ටරි / තොග | 1538 | 1,117 |
| අනෙකුත් ජංගම මූල්‍ය වත්කම් | 14,759 | 6,492 |
| | 48,795 | 36,053 |
| නොනිමි වැඩ (අස්පෘශ්‍ය වත්කම්) | 1,421 | |
| **ජංගම / ජංගම නොවන වත්කම්** | | |
| ආයෝජන | 145,371 | 125,239 |
| ජංගම නොවෙන අනෙකුත් මුල්‍ය වත්කම් (සේවක මණ්ඩල ණය) | 8,254 | 6,089 |
| විලම්භිත සේවක පිරිවැය | - | 2,350 |
| විකිණීම සඳහා තබා ගෙන ඇත යනුවෙන් වර්ගීකරණය කර ඇති වත්කම් | - | 324 |
| බද්දට ගත් ගොඩනැගිලි | 925 | 950 |
| දේපල පිරියත හා උපකරණ | 57,777 | 69,063 |
| | 212,328 | 204,016 |
| | | |
| **මුළු වත්කම්** | **261,123** | **240,069** |
| | | |
| **වගකීම්** | | |
| **ජංගම වගකීම්** | | |
| උපචිත වියදම් | 16,025 | 19,651 |
| ගෙවිය යුතු සහ අනෙකුත් වගකීම් | 5,435 | 3,321 |
| | 21,461 | 22,972 |

| | **31.12.2013 දිනට රු 000'** | **31.12.2012 දිනට රු 000'** |
|---|---:|---:|
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 21,458 | 17,833 |
| | | |
| **මුළු වගකීම්** | 42,919 | 40,805 |
| | | |
| **මුළු ශුද්ධ වත්කම්** | **218,204** | **199,264** |
| | | |
| **ශුද්ධ වත්කම් / සම කොටස්** | | |
| සමුච්චිත අරමුදල | 63191 | 63,191 |
| විලම්භිත ආදායම | 57,517 | 70,337 |
| සංචිත | 98,917 | 65,736 |
| | **219,625** | **199,264** |
| **මුළු ශුද්ධ වත්කම් / සම කොටස්** | **219,625** | **199,264** |

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ මුදල් | අධ්‍යක්ෂ ජනරාල් | සභාපති |
| පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය |

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | 2013 12 31 දින වන විට<br>රු 000' | 2012 12 31 වන දින වන විට රු 000' |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | |
| පුනරාවර්තන ප්‍රදාන | 226,408 | 159,222 |
| දඩ ආදායම | 28,513 | 34,529 |
| වෙනත් ආදායම් | 32,628 | 21,717 |
| | **287,549** | **215,468** |
| **වියදම්** | | |
| සේවක වැටුප් | 139,879 | 116,122 |
| ගමන් ගාස්තු | 12,172 | 9,664 |
| සැපයුම් හා පාරිභෝජ්‍ය භාණ්ඩ | 11,417 | 11,055 |
| නඩත්තු | 6,674 | 4,364 |
| කොන්ත්‍රාත් සේවා | 38,691 | 39,233 |
| ක්ෂය වීම් | 17,557 | 11,680 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 28,087 | 17,518 |
| මුදල් පිරිවැය | 107 | 128 |
| වත්කම් බැහැරකිරීමෙන් ලද ලාභය / අලාභය | (148) | 1,061 |
| **මුළු වියදම** | **254,732** | **208,702** |
| **අදාල කාලය සඳහා මුළු ශුද්ධ අතිරික්තය / හිඟය** | **32,817** | **6,766** |

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2013<br>රු 000' | 2012<br>රු 000' |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් හරහා අතිරික්තය / හිඟය | **32,965** | **5,704** |
| වත්කම් බැහැර කිරීමෙන් ලද ලාභය / අලාභය | (148) | 1,062 |
| **ගැලපුම්** | | |
| ක්ෂයවීම් | 17,556 | 11,680 |
| පාරිතෝෂික ප්‍රතිපාදනයන්හි වැඩිවීම් | 3,625 | 3,706 |
| ක්‍රමක්ෂය | 25 | 25 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **54,023** | **22,177** |
| ගෙවිය යුතු ඒවායෙහි වැඩිවීම | (1,510) | 1,051 |
| අනෙකුත් ජංගම වත්කම්වල වැඩිවීම | (11,831) | 21,404 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **40,682** | **44,632** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබෙන මුදල් ප්‍රවාහය** | | |
| පිරියත සහ උපකරණ මිලදී ගැනීම | (6,223) | (53,014) |
| අස්පෘශ්‍ය වත්කම්වල වැඩිවීම | 1,421 | |
| පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල | 275 | 1,831 |
| ආයෝජන වල වැඩිවීම | (20,132) | (50,819) |
| දීර්ඝකාලීන ණය වල වැඩිවීම | 185 | 1,952 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබුණ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(27,316)** | **(100,050)** |

| | 2013<br>රු 000’ | 2012<br>රු 000’ |
|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබුණ මුදල් ප්‍රවාහ** | | |
| විලම්භිත ආදායම | (13,770) | 33,978 |
| පාරිභෝගික ආරක්ෂණ අරමුදල / සංචිත | 1,314 | 7,785 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබුණ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(12,456)** | **41,763** |
| | | |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම (අඩුවීම)** | 910 | (13,655) |
| **කාලසීමාව ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ** | 9,865 | 23,520 |
| **කාලසීමාව අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | **10,775** | **9,865** |

**<u>ගිණුම් සඳහා සටහන්</u>**

**1. ආයතනික තොරතුරු**

**1.1** 1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත සහ 1987 අංක 1 දරණ සාධාරණ මිල කොමිසම් පනත ද 1950 මිල පාලන පනත ද අහෝසි කරමින් සම්මත කර ගන්නා ලද 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු අධිකාරිය පනත මගින් පාරිභෝගික කටයුතු අධිකාරිය ඇති කර තිබේ. 2011 සැප්තැම්බර් 15 වන දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/58 / 02 ප්‍රකාරව පාර්ලිමේන්තු කටයුතු අධිකාරිය නියාමන ආයතන "A" කාණ්ඩයේ "A" උපකාණ්ඩය යටතේ කාණ්ඩගත කර තිබේ.

**1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය**

අධිකාරියේ මූලික ක්‍රියාකාරකම වනුයේ පාරිභෝගිකයින් ආරක්ෂා කිරිම සඳහා වෙළඳාම නියාමනය කිරීමයි.

**1.3** 2012 වර්ෂ අවසානය වන විට අධිකාරියේ සේවයෙහි නියුතු කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 241 ක් වේ.

**1.4 සැලකිය යුතු කොටස් හිමිකම / සම කොටස්**

පාරිභෝගික කටයුතු අධිකාරියට මූලික වශයෙන් මුදල් ප්‍රදාන ලබා දෙන්නේ මහා භාණ්ඩාගාරයෙන් වේ. අරමුදලෙහි ශුද්ධ ශේෂයෙන් 1/3 ක් සම්පාදනය වී ඇත්තේ දඩ ලෙස ලබන ආදායමින් වන අතර එය අධිකාරියට සෘජුවම ලැබෙන ආදායමක් වන අතර, එය අධිකාරියේ සම කොටස්වලට නියෝජනය වී තිබේ.

**2.1 රජයේ ප්‍රදාන**

යම් ප්‍රදානයක් ලැබෙනු ඇති බවට යුක්තිසහගත සහතිකයක් පවතින විට එවන් ලැබීම් රජයේ ප්‍රදාන ලෙස හඳුනාගනු ලැබේ. යම් ප්‍රදානයක් වියදම් අයිතමයකට සම්බන්ධ වේ නම්, එය වර්ෂය සඳහා වන ආදායමක් ලෙස පිලිගනු ලැබේ. ප්‍රදානය වත්කමකට සම්බන්ධ වන්නේ නම්, අදාල වත්කමේ ප්‍රයෝජනයට ගත හැකි ආයුකාලය මුළුල්ලේම සමාන ප්‍රමාණවලින් ලැබෙතැයි අපේක්ෂිත ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

මුදල් නොවන වත්කමක් පාරිභෝගික කටයුතු අධිකාරිය වෙත ලැබුණු විට එකී වත්කමෙහි සහ ප්‍රදානයෙහි නාමික අගය සටහන් කරගෙන, වත්කමේ බලපවත්වන ප්‍රතිලාභය සමාන වාර්ෂික වාරික ලෙස පරිභෝජනය කිරීමේ රටාවක් අනුව එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය මුළුල්ලේ ලාභ හෝ අලාභ වශයෙන් මුදා හරිනු ලැබේ. වත්කම් සහ සාධාරණ වටිනාකම මත ගණනය කරන ලද මුදල් නොවන ප්‍රදාන හා සම්බන්ධ වන රජයේ ප්‍රදාන විලම්භිත ආදායම වශයෙන් ශේෂපත්‍රය මගින් ඉදිරිපත් කර තිබේ.

**2. පොදු ගිණුම් ප්‍රතිපත්ති**

**2.1** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙහි රජයේ ගිණුම් ප්‍රමිතීන් සඳහා වන කමිටුව විසින් නිකුත් කර ඇති රජයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිද්දෙන් පාරිභෝගික කටයුතු අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ.

**2.2** සාධාරණ ලෙස වටිනාකම මනිනු ලැබූ මෝටර් වාහන හැරුණු කොට, මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් මූල්‍ය ප්‍රකාශන පිලියෙල කොට තිබේ.

**2.3 දඩ ආදායම**

**2.3.1** අධිකාරියේ සාමාන්‍ය ක්‍රියාකාරකම් සඳහා දඩ ආදායම භාවිතා නොකළ හෙයින් මින් පෙර අවස්ථාවන්හිදී දඩ ආදායම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් නොකරන ලදී. කෙසේ නමුත් 2011 වසරේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව මෙවැනි ආදායම් පරිහරණය කිරීමට පාරිභෝගික කටයුතු අධිකාරිය ආරම්භ කොට තිබේ. එම නිසා දඩ වශයෙන් ලැබෙන ආදායමද ආදායමක් ලෙස සලකනු ලබන අතර දඩ සම්බන්ධයෙන් වන සියලුම වියදම් සහ ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පෙන්නුම් කර තිබේ.

**2.3.2** පාරිභෝගික කටයුතු අධිකාරියේ අදාල වැටලීම් නිලධාරීන් විසින් ලබා දෙන නඩු අංකය සහ, තම ප්‍රේෂණ සමගින් අදාල අධිකරණ විසින් එවනු ලබන නඩු අංක අතර ඇති යම් යම් අසමානතා හේතුවෙන් අධිකාරියට මුදල් ලැබුණද එකී මුදල දඩ ආදායමක් ලෙස හඳුනා නොගන්නා ඇතැම් අවස්ථාවන්ද තිබේ. එවන් අවස්ථාවන්හිදී එකී මුදල් සැබැවින්ම අධිකාරියට ලැබිය යුතු මුදල් වේ ද නැතහොත් වැරදීමකින් අධිකරණය විසින් ප්‍රේෂණය කර ඇත්ද යන්න නිශ්චය කර ගැනීමේ අරමුණ ඇතිව එම මුදල් විලම්භිත - දඩ ආදායම නම් වූ ගිණුමට මාරු කිරීම සාමාන්‍ය සිරිත වේ. වර්ෂය අවසාන වන තෙක්ම එවන් මුදල් හඳුනාගැනීමකින් තොරව ගිණුමේ රැඳී තිබුණහොත් ඒවා පාරිභෝගික කටයුතු අධිකාරියේ පාරිභෝගික ආරක්ෂණ අරමුදලට බැර කරනු ලැබේ.

**2.4 මුදල් වර්ෂය**

අධිකාරියේ මුදල් වර්ෂය ලෙස සලකනු ලබන්නේ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන කැලැන්ඩර් වර්ෂයයි.

**3. වත්කම් වල පදනම් සහ ඒවායේ තක්සේරුව**

**3.1.1.** මෝටර් වාහන සම්බන්ධයෙන් හැරුණු විට පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් පිරිවැය ආදර්ශය එහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස භාවිතා කරනු ලැබේ. (SLPSAS 7)

**3.1.2** දේපල, පිරියත සහ උපකරණ පිරිවැය අනුව ප්‍රකාශ කෙරෙන අතර ඊට දේපල පිරියත සහ උපකරණයන්හි කොටස් වෙනුවට නව කොටස් යෙදීම ද ඇතුලත් වන්නා වූ සමුච්චිත පිරිවැයේ ශුද්ධ අගයක් ලෙස දක්වනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ වල සැලකිය යුතු කොටසක් වෙනුවට නව කොටසක් යෙදීමට සිදු වන විට එම ඉවත් කර කොටස පිලිගැනීමෙන් ඉවත් කොට නව කොටස එහි ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂයවීම්ද ඇතුළුව පිලිගැනීමට ලක් කරනු ඇත. අලුත්වැඩියා සහ නඩත්තු සඳහා පිරිවැය ඒවා දරන්නට වන අන්දමෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හඳුනාගැනීමට ලක් කර තිබේ.

යළි තක්සේරුවේදී ඇති යම් අතිරික්තයක් වුවහොත් එය සම කොටස් සමුච්චිත ලෙස හඳුනාගෙන වත්කම් යලි තක්සේරු සංචිතයේ සමුච්චිත සම කොටස් ලෙස හඳුනාගනු ලැබේ.

**3.1.3** දේපල පිරියත සහ උපකරණ වල පිරිවැය ලෙස සලකනු ලබන්නේ එම වත්කම් ඒවායින් ලබා ගැනීමට අපේක්ෂා කරන ප්‍රයෝජනය ලබා ගත හැකි මට්ටමට ගෙන ඒම සඳහා දරන්නට වන යම් වියදමක් වෙතොත් එයද ඇතුළුව මිලදී ගැනීමට හෝ ඉදිකිරීමට දරන්නට වූ පිරිවැය වේ.

**3.1.4** ව්‍යාපාරය පවත්වාගෙන යාමට හෝ වත්කමක ආයු කාලය වර්ධනය කිරීමට භාවිතා කෙරුණු ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීමට, දීර්ඝ කිරීමට හෝ වැඩි දියුණු කිරීමට දරන්නට වූ පිරිවැය ප්‍රාග්ධන වියදම් ලෙස සලකා තිබේ.

**3.1.4** අයවැය චක්‍රලේඛ අංක 150 ප්‍රකාරව 2012 වර්ෂයේ ආරම්භයේදී පාරිභෝගික කටයුතු අධිකාරියේ වාහන සංචිතයට වාහන 5 ක් (ටොයෝටා හයිඒස් වෑන් රථ 4 ක් සහ ටොයෝටා මෝටර් රථයක්) එකතු කරන ලදී. ඒ සඳහා වන රුපියල් 48,484,357 ක ඉන්වොයිසිය මුදල් නොවන ප්‍රදානයක් ලෙස සලකා සුදුසු පරිදි ගිණුම්ගත කර තිබේ.

**3.1.5 කෙරෙමින් පවතින වැඩ ( රු.1,421,428.00)**

2013.12.31 වන දින වන විට කොන්සියුමර් වොච් ව්‍යාපෘතිය සඳහා වියදම් කරන්නට වූ රුපියල් 1,421,428.00 මුදල් ප්‍රමාණය මෙමගින් නියෝජනය වේ.

**3.2 ක්ෂයවීම්**

අධිකාරිය විසින් අත්පත් කර ගනු ලබන සියලුම වත්කම් එකී වත්කම භාවිතයට ගත හැකි මාසයේ සිට ක්ෂය වීම ආරම්භ කරනු ලැබේ.

**3.2.1** දේපල පිරියත සහ උපකරණ වල ඇස්තමේන්තුගත ආයුකාලය තුළදී එහි පිරිවැය කපා හැරිය හැකි වන අන්දමින් සංගත පදනමකින් ක්ෂයවීම් සිදු කර තිබේ.

| | |
|---|---|
| කාර්යාලයේ ලී බඩු සහ සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 10% |
| පරිගණක උපකරණ | 20% |
| මෝටර් වාහන | 20% |
| කාර්යාලයේ පාටිෂන් | 20% |
| පාරිභෝජ්‍ය නොවන | 10% |

**3.2.2** ක්ෂයවීම් ගණනය කිරීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය සරල රේඛිය ක්‍රමය භාවිතා කරනු ලබයි.

**3.2.3** පුස්තකාල පොත් සඳහා ක්ෂයවීම් අඩු කරනු නොලැබේ.

**3.2.4** වර්ෂයට අදාල ක්ෂයවීම් අගය විලම්භිත ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ.

### 3.3 ගොඩනැගිලි පරිශ්‍රය- කුරුණෑගල

පාරිභෝගික කටයුතු අධිකාරියේ කුරුණෑගල කාර්යාලය වෙත කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් විසින් පවරා ඇති ගොඩනැගිලි පරිශ්‍රය සඳහා ගෙවිය යුතු රුපියල් මිලියන 1 ක ගෙවීම වසර හතලිහක් මුළුල්ලේ ක්‍රම ක්ෂය වී තිබේ.

### 3.4 ණය ගැතියෝ සහ ලැබිය යුතු

උපලබ්ධි වෙතැයි ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයට ණයගැතියෝ සහ ලැබිය යුතු අගයන් ප්‍රකාශ කර තිබේ.

**3.5** පිරිවැයේ පහළ අගයට හෝ ශුද්ධ උපලබ්ධි අගයට අනුව ඉන්වෙන්ටරි තක්සේරු කර තිබේ.

### 3.6 මුදල් හා මුදල් සමාන දෑ

අත ඇති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ කෙටිකාලින ආයෝජන මුදල් හා මුදල් සමාන දෑ යනුවෙන් අදහස් කෙරේ.

**3.6.1** මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් හා මුදල් සමාන දෑ යන්නට ඇතුලත් වී ඇත්තේ අත ඇති මුදල් සහ බැංකුවේ තැන්පතු වේ.

### 3.7 මූල්‍යමය මෙවලම්

### 3.7.1 කල් පිරෙන තුරු රඳවා තබාගත් ආයෝජන

පාරිභෝගික කටයුතු අධිකාරියේ ස්ථාවර තැන්පතු ව්‍යුත්පන්න නොවන ස්වභාවයේ ඒවා වන අතර ස්ථාවර ගෙවීම් සහ ස්ථාවර වූ කල් පිරෙන දින සහිත ඒවා වන හෙයින් එම ස්ථාවර තැන්පතු කල් පිරෙනතෙක් තබා ගෙන ඇති ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ස්ථාවර තැන්පතු මූලික වශයෙන් මනිනු ලබන්නේ පිරිවැය අනුව වේ.

ස්ථාවර තැන්පතු අදාල කාලසීමාව තුළ ආපසු ලබානොගැනීම පිළිබඳව පසුගිය අත්දැකීම් පාරිභෝගික කටයුතු අධිකාරියට ඇති හෙයින් ස්ථාවර තැන්පතු වලින් බහුතරය අවම වශයෙන් වසර තුනක්වත් යන තුරු ඒ අයුරින්ම පැවතෙනු ඇතැයි නිගමනය කෙරේ.

### 3.7.2 විකිණීමට තබා ගෙන ඇති ජංගම නොවන වත්කම්

ජංගම නොවන වත්කම් සහ විකිණීමට තබාගෙන ඇති යනුවෙන් වර්ගීකරණය කර ඇති අපහරණ මනිනු ලබන්නේ ඒවායේ ධාරණ අගයන්ගේ අවම වටිනාකම සහ සාධාරණ වටිනාකමින් අඩු කරනු ලබන අලෙවි පිරිවැයට වේ.

## 4. වගකීම් සහ ප්‍රතිපාදන

### 4.1 ගෙවිය යුතු

ගෙවිය යුතු මුදල් ඒවායේ පිරිවැයට ප්‍රකාශ කර තිබේ.

### 4.2 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

පාරිභෝගික කටයුතු අධිකාරිය සතුව ප්‍රතිලාභ අර්ථ දැක්වූ විශ්‍රාම සැලසුම් 2 ක් පවතින අතර එම සැලසුම් දෙක සඳහාම දායකත්වය දැරීම වුවමනා කෙරේ.

### 4.2.1 අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂික

පාරිතෝෂිකය යනු අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුමකි. අදාල නීති ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට අධිකාරිය බැඳී සිටී. මෙම බැඳීම ඉටු කරනු වස් ශේෂපත්‍රයේ ප්‍රතිපාදන ඉදිරියට ගෙන යනු ලබන අතර එය ගණනය කරනු ලබන්නේ සේවය කරන පළමු වසරෙන් ඇරඹි සම්පූර්ණ වන එක් එක් වර්ෂය වෙනුවෙන් කාර්ය මණ්ඩලයේ සියලු දෙනා විසින්ම මුදල් වර්ෂයේ අවසන් මාසයේදී ලබන මාසික වැටුප මත පදනම් වී වේ. වර්ෂය ආරම්භයේදී ඉදිරියට ගෙන ආ ප්‍රතිපාදන සහ වර්ෂය අවසානයේදී ඉදිරියට ගෙන යන ප්‍රතිපාදන අතර ඇතිවන වෙනස සම්බන්ධයෙන් ආදායම් ප්‍රකාශය හරහා කටයුතු කරනු ලැබේ.

පාරිතෝෂිකය සඳහා වන ප්‍රතිපාදන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අවම වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා ගණනය කරනු ලැබේ. මහා භාණ්ඩාගාරය විසින් පූර්වයෙන් අරමුදල් මුදා නොහරින හෙයින් පාරිතෝෂික සැලසුමට සහාය ලබා දීම පිණිස පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් කිසිදු මුදලක් ආයෝජනය කර නොමැතී

කෙසේ නමුත් පාරිතෝෂික ප්‍රතිපාදන වෙනම ආයෝජනය කිරීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් දැන් අනුමැතිය ලබා ගෙන තිබේ. ඒ අනුව, 2014 වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන රුපියල් 4, 603,706 ක මුදල ආයෝජනය කර ඇති අතර 2013.12.31 වන දිනට සමුච්චිත ප්‍රතිපාදන වන රුපියල් 17,833,134 ක මුදල අවසන් අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ආයෝජනය කෙරෙනු ඇත.

අවශ්‍ය කරන වගකීම තවමත් පූර්ණ වශයෙන් ආයෝජනය කර අවසන් නොවන හෙයින් ආයුගණක ලාභ හෝ අලාභ හඳුනාගනු නොලැබේ.

### 4.2.2 අර්ථකථනය කළ දායකත්ව සැලසුම් / සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාල නීති සහ රෙගුලාසි ප්‍රකාරව සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා සුදුසුකම් ලබයි. සේවකයින් ආවරණය කෙරෙමින් අර්ථසාධක අරමුදලට සහ භාරකාර අරමුදලට සිදු කරන දායකත්වය ආදායම් ප්‍රකාශයේදී වියදමක් ලෙස හඳුනා ගැනේ.

අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයින්ගේ දළ වේතන වලින් පිලිවෙලින් සියයට පහලොවක් සහ සියයට තුනක් දායකත්වය දරනු ලැබේ.

## 5. ආදායම

### ආදායම් හඳුනාගැනීම

ආදායම පාරිභෝගික කටයුතු අධිකාරියට ගලා එන්නේ ද යන්න සහ එය විශ්වසනීය අන්දමින් මිනිය හැකි වේද යන කාරණා මත පදනම් වෙමින් ආදායම හඳුනා ගනු ලැබේ.

**පොලී ආදායම**

කල්පිරෙන තුරු හඳුනාගත් මූල්‍ය වත්කම් යනුවෙන් වර්ගීකරණය කරනු ලබන මූල්‍ය වත්කම් (ස්ථාවර තැන්පතු) හරහා ලැබෙන පොලිය පොලී ආදායම වශයෙන් නාමික පොලී අනුපාතය භාවිතා කරමින් වාර්තා කරනු ලැබේ.

**රජයේ ප්‍රදාන**

ප්‍රදානය ලැබෙනු ඇතැයි සාධාරණ සහතිකයක් පවතින විට සහ ඒ හා සම්බන්ධ වන සියලුම කොන්දේසි වලට අනුකූලව කටයුතු කරන විට ඒ අනුව රජයේ ප්‍රදාන හඳුනා ගනු ලැබේ. යම් ප්‍රදානයක් වියදම් අයිතමයකට සම්බන්ධ වේ නම් (පුනරාවර්තන ප්‍රදාන) එය අදාල කාල සීමාව තුළ ලැබෙන ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රදානය යම් වත්කම් අයිතමයක් සමගින් සම්බන්ධ වන විට (ප්‍රාග්ධන ප්‍රදාන) එය විලම්භිත ආදායමක් ලෙස හඳුනාගනු ලබන අතර අදාල වත්කමේ අපේක්ෂිත ආයු කාලය මුළුල්ලේ සමාන ප්‍රමාණයන්ගෙන් මුදා හැරෙන ආදායම් ලෙස සලකනු ලැබේ.

පාරිභෝගික කටයුතු අධිකාරියට මුදල් නොවන ප්‍රදානයන් ලැබෙන විටදී එම වත්කම් සහ ප්‍රදානයන් ඒවායේ නාමික අගයට වාර්තා කර ගනු ලබන අතර එකී වත්කමෙහි අපේක්ෂිත ආයු කාලය මුළුල්ලේ ආදායම් ප්‍රකාශයට මුදා හැරෙනු ඇත. (IAS 20)

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඊසී/ඊ/සීඒඒ/එඒඒ/2013 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015 ජනවාරි 19 දින |

සභාපති,

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 පැහැදිලි නොකළ වෙනස්කම්

ගිණුම සමඟ ඉදිරිපත් කර තිබූ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ ගණකාධිකරණ ප්‍රතිපත්ති වෙනස්වීම ලෙස රු.366,000 ක් දක්වා තිබූ නමුත් ඒ පිළිබඳ පැහැදිලි කිරීම ඉදිරිපත් නොවූ බැවින් එහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 19 වැනි වගන්තිය ප්‍රකාරව සාදන්නකු හෝ වෙළෙන්දකු විසින් අධික මිලකට භාණ්ඩ හෝ සේවා සපයන බව හෝ, භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් යම් ආකාරයකට වෙළඳපොළ අයථා පරිදි භාවිත කිරීමක් හෝ වෙනත් යම් වෙළෙඳපොළ දෝෂයක් පවතින බව අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී යන අවස්ථාවක, එය විමර්ශනය කර වාර්තා කිරීම සඳහා සභාව වෙත යොමු කළ යුතු වුවත්, ගෑස් මිල පහළ ගිය 2013 මාර්තු සිට ඔක්තෝබර් දක්වා කාල පරාසය තුළ එක් ගෑස් සමාගමක් විසින් අවස්ථා 04 කදී ගෑස් මිල අඩු නොකිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා එසේ කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ වැඩ කටයුතුවලින් වූ මෙහෙයුම් ප්‍රතිඵලය රු.32,816,755 ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.6,765,819 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.26,050,936 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පුනරාවර්තන ප්‍රතිපාදන ඉකුත් වර්ෂයට වඩා වැඩියෙන් ලැබීම විවිධ ආදායම් වැඩිවීම ස්ථාවර තැන්පතු සඳහා ලැබූ පොළී ආදායම වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි බලපා තිබුණි. එමෙන්ම අධිකාරියේ ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වියදම් රු.208,702,621 ක් වූව ද, සමාලෝචිත වර්ෂයේ දී එය රු.254,731,766 ක් වූයෙන් රු.46,029,145ක් එනම් සියයට 22 ක වියදම්වල වැඩිවීමක් වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු.4,970,000 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී තිබූ අතර අධිකාරිය විසින් වත්කම් මිලදී ගැනීම සඳහා රු. 6,221,843 ක් වැය කර තිබුණෙන් ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු. 1,251,843 ක් වියදම් දරා තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය 2012 ජූනි 18 දිනැති අංක 1763/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ළදරු කිරි ආහාර වෙනුවෙන් මිල පාලනයක් සඳහා මැදිහත් වී තිබුණද එම මිල පැනවීම සාධාරණ නොවන බව දන්වමින් අධිකාරියට විරුද්ධව එක් කිරිපිටි සමාගමක් නඩු පවරා තිබුණි.

(ආ) 2010 මහ මැතිවරණ කාල සීමාව තුළ කිසිඳු දැනුම් දීමකින් තොරව සේවයෙන් පහකර තිබූ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරිය එයට විරුද්ධව කම්කරු උසාවියේ නඩු පවරා තිබුණි. දෙපාර්ශවය විසින් නඩුව සමථයකට පත් කිරීමේදී අධිකාරිය විසින් ඒ සඳහා රු. 3,560,400 ක වන්දියක් අදාළ නිලධාරියාට ගෙවා නඩුව සමථයකට පත්කර ගෙන තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් පාඩුවක් සිදු වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුකුළු මස් මිල වැඩි වීම

2013 මැයි 30 දිනැති අංක 1812/24 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සම සහිත බ්‍රොයිලර් කුකුළු මස් සඳහා පමණක් විකිණිය හැකි උපරිම මිලක් පනවා තිබුණද, සම ඉවත් කළ කොටස් වශයෙන් අලෙවි කරනු ලබන අනිකුත් කුකුළු මස් සඳහා එවැනි විකිණිය හැකි උපරිම මිලක් නියම කර නොතිබීම හේතුවෙන් එම කුකුළු මස් විවිධ මිල ගණන් යටතේ අලෙවි කිරීමට අවස්ථාව සැලසී තිබුණි.

(ආ) කිරි පිටි මිල වැඩිවීම

(i) සම්පූර්ණ යොදය සහිත කිරි පිටි

පදනම් වර්ෂයේ ආනයනික කිරි පිටි මිල ඉහළ යාමත් සමඟ කිරි පිටි බෙදාහැරීමේ නියුතු සමාගම් සිය නිෂ්පාදනවල මිල ගණන් වැඩි කිරීමට කිහිප අවස්ථාවක අධිකාරියෙන් ලිඛිත ඉල්ලීමක් කර තිබූ නමුත් අධිකාරිය විසින් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොතිබුණි. මෙකී ඉල්ලීම් ඉදිරිපත් කළ එක් සමාගමක් අධිකාරියේ ලිඛිත අවසරය ලබා නොගෙන 2013 ඔක්තෝබර් මාසයේ කිරි පිටි මිල වැඩි කර තිබූ අතර අධිකාරිය විසින් ඒ සඳහා පියවර ගැනීමට කටයුතු කිරීමේදී එකී සමාගම අධිකාරියට විරුද්ධව අභියාචනාධිකරණයේ නඩු පවරා තිබුණි. මේ සම්බන්ධව පනතේ 18(4) වගන්තිය ප්‍රකාරව අයදුම්පත ලැබී දින 30 ක් ඇතුළත තීරණයක් ලබාදීමට අධිකාරිය අපොහොසත් වීම මත මිල වැඩි කිරීමට සමාගමට හිමිකමක් ඇති බව නීතිපතිවරයා සඳහන් කර තිබුණි.

(ii) යොදය රහිත කිරි පිටි

2003 අගෝස්තු 20 දිනැති අංක 1302/24 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් කිරි ආහාර නිශ්චිත භාණ්ඩයක් ලෙස ප්‍රකාශ කර තිබූ නමුත් යොදය රහිත කිරි පිටි සඳහා අධිකාරිය විසින් පාලන මිලක් නියම කර නොතිබුණි. මේ හේතුව නිසා නිෂ්පාදකයන් හා බෙදාහරින්නන් අධිකාරියේ අවසර නොමැතිව තමන්ට අවශ්‍ය පරිදි කිරි පිටි මිල තීරණය කර තිබුණි.

(ඈ) තිරිඟු පිටි මිල තීරණය කිරීම

--------------------------------

2004 මැයි 23 දිනැති අංක 1342/1 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් තිරිඟු පිටි නිශ්චිත භාණ්ඩයක් ලෙස නම් කර තිබුණද, තිරිඟු පිටි නිෂ්පාදනය කර බෙදා හැරීමේ කටයුතු කරන සමාගම් 02 ක් අධිකාරියේ අවසර නොලබා මිල වැඩිකිරීමට කටයුතු කර තිබූ නමුත් රජයේ නීතිපතිවරයා විසින් මෙම භාණ්ඩය පාරිභෝගික අධිකාරියේ 18 (2) වගන්තිය අනුව පාලනය වන්නක් බවත් මිල වැඩි කිරීමේදී අධිකාරියේ පූර්ව අනුමැතිය මත සිදුකළ යුතු බවත් දන්වා තිබූ නමුත් මෙම මිල පාලනය සම්බන්ධ අධිකාරියේ බලය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ලික්විඩයිට් පෙට්‍රෝලියම් (එල් පී) ගෑස් මිල තීරණය කිරීම

--------------------------------------------------------------

ගෑස් බෙදා හැරීමේ නිරත සමාගම් 02 ක පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සමඟ ඇති කරගෙන ඇති ගිවිසුමට අනුව සෑම මාස 02 කට වරක් ගෑස් මිල සංශෝධනය සඳහා පිරිවැය ඇස්තමේන්තු සකස් කර අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වූවත්, එක් සමාගමක් 2013 වර්ෂය තුළ කිසිදු මිල සංශෝධන ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර නොතිබුණි.

2013 වර්ෂය මැද භාගයේදී ලෝක වෙළඳපළේ ගෑස් මෙට්‍රික් ටොන් 01 ක මිල එක්සත් ජනපද ඩොලර් 955 සිට 762 දක්වා අඩු වූව ද, අදාල සමාගම මිල සංශෝධන ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් නොකිරීම නිසා ගෑස් මිල අඩු කිරීමට නොහැකි වී තිබුණි. ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් අධිකාරිය කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) පානීය ජල බෝතල්

---------------------

2012 වර්ෂයේ අධිකාරිය විසින් කළ විමර්ෂණයකට අනුව ජල බෝතල් අනිවාර්ය තත්ත්ව පරීක්ෂාවකට යටත් විය යුතු බවත් පාරිභෝගිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා අධිකාරියේ පාලනයට යටත් විය යුතු බවත් ප්‍රමිති සහතිකය ලබා ගැනීම අනිවාර්ය බවත් පෙන්වාදී තිබුණි.

පනත මඟින් අධිකාරියට පැනවී ඇති බලතල ප්‍රයෝජනයට ගෙන ප්‍රමිතියෙන් හා මිල පාලනයෙන් තොරව පවතින මෙම කර්මාන්තය පාලනය කිරීමට කටයුතු සූදානම් කර වර්ෂ 02 කට ආසන්න කාලයක් ගත වී ඇතත් ඒ සඳහා නීති රීති නිකුත් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් වතුර බෝතලයක සැපයුම් මිල හා සිල්ලර මිල අතර සියයට 25 සිට 60 ක ආන්තිකයක් යටතේ වෙළඳපළ මිල තීරණය වී තිබුණි.

(ඊ) පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය

පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් පාරිභෝගිකයින් වෙත දැනුම් දීම හා පාරිභෝගික පැමිණිලි සඳහා විසඳුම් ලබා දීම වෙනුවෙන් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද, ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී නොතිබුණු බැවින් එය ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය විසින් රු.5,590,834 ක් වැය කර තිබුණි.
මේ සම්බන්ධව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය යටතේ පාරිභෝගික විමසුම් ලබා ගැනීම සඳහා රු.5,401,427 ක උපකරණ සවිකිරීමට ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීමක් සිදු කර නොතිබූ අතර අධිකාරියේ සභාපතිවරයා නිර්දේශ කළ සමාගම් කිපයක් අතරින් මිල ගණන් කැඳවා අමාත්‍යාංශ මිලදී ගැනීමේ කමිටුව විසින් එක් සමාගමකට පවරා තිබුණි.

(iii) ව්‍යාපෘතිය සඳහා අධිකාරිය විසින් රු. 5,401,427 ක් වටිනා තාක්ෂණ උපකරණ අධිකාරියට අයත් පරිශ්‍රය තුළ සවිකර නොතිබුණි.

(iv) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 6.6 ක් වූ බැවින් එය අවසන් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා කිසිදු වැඩපිළිවෙලක් අධිකාරිය විසින් සකස් කර නොතිබුණි.

4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2013 යල කන්නයේ වී මිල පහත වැටීම වළක්වාලීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DFD/Agri/PP-2013 Yala හා 2013 ජූලි 17 දිනැති ලිපිය මඟින් 2012/13 මහ කන්නයේ දිසාපතිවරුන් වෙත ලබාදුන් ප්‍රතිපාදන යටතේ මිලදීගත් වී තොග සත්ත්ව ආහාර ලෙස විකිණීමට නිර්දේශ කර තිබුණි. ඒ අනුව, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2008 වර්ෂයේ දී මිනිස් පරිභෝජනය සඳහා සුදුසු තත්ත්වයේ පවතින සහල් හෝ වී සත්ත්ව ආහාර ලෙස භාවිතා කිරීම තහනම් කරමින් පනවා තිබූ නියෝගය 2013 ජූලි 29 දින අංක 1821/5 දරන ගැසට් නිවේදනයෙන් පරිවර්තන්න කර තිබුණි. සත්ත්ව ආහාර ලෙස භාවිතා කිරීමට තීරණය කළ 2012/13 මහ කන්නයේ මිලදී ගත් මෙම වී තොග මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු ඉතා හොඳ තත්ත්වයේ පවතින බව වී අලෙවි මණ්ඩලයේ වී ගබඩා පරීක්ෂාවේදී අනාවරණය විය.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 370 ක් වූ අතර එදිනට තථ්‍ය සේවක සංඛ්‍යාව 275 ක් විය. ඒ අනුව තනතුරු 95 ක පුරප්පාඩු පිරවීමට ක්‍රියාකර නොතිබුණි. මේ අතර අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සංවර්ධන නිලධාරීන් 37 දෙනෙකු අධිකාරියට අනුයුක්ත කර තිබුණි.

(ආ) අධිකාරියේ මාධ්‍ය නිලධාරි තනතුරෙහි රාජකාරි කටයුතු කළ නිලධාරියෙකු 2013 මාර්තු 15 දින සිට අභ්‍යන්තර හා වෙළඳ කටයුතු අමාත්‍යවරයාගේ මාධ්‍ය ලේකම් ලෙස වැඩ භාරගෙන තිබියදීත් එම නිලධාරියාට 2013 ජූනි 30 දක්වා මාස 3 ½ ක කාලයක් සඳහා රු. 94,938 ක වැටුප් හා රු.17,084 ක සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල් ද ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.2 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දුන් නියෝග ක්‍රියාත්මක කිරීම

2012 ඔක්තෝබර් 03 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබූ පහත සඳහන් නියෝග 2013 දෙසැම්බර් 31 දිනට ද ක්‍රියාත්මක කර නොතිබුණි.

(අ) අධිකාරියේ සේවයේ නියුතු සුදුසුකම් ලත් නිලධාරියෙකු අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පත්කිරීමට කටයුතු කරන ලෙස අධිකාරියට නියෝග කර තිබුණ ද, 2013 දෙසැම්බර් 31 දිනට ද එය ක්‍රියාත්මක කර නොතිබුණි. ද්විතියික පදනම මත බඳවාගත් නිලධාරියෙකු එම තනතුරේ රාජකාරි කටයුතු ඉටුකරන බව නිරීක්ෂණය විය.

(ආ) සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ වාහනයක් අළුත්වැඩියා කිරීම සහ ඊට වැය කරන ලද රු. 3,147,903 ක මුදල එකී අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර නොගැනීම සම්බන්ධව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට වාර්තාවක් ලබාදෙන ලෙස කරන ලද නියෝගය 2013 දෙසැම්බර් 31 දිනටද ක්‍රියාත්මක කර නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මානව සම්පත් කළමනාකරණය
(ඇ) වත්කම් පාලනය
(ඈ) ව්‍යාපෘති පාලනය

**ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න**
**විගණකාධිපති (වැඩ බලන)**

**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ සභාපතිවරයාගේ අදහස් දැක්වීම</u>**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2013.12.31 දිනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් හෝ අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව විගණකාධිපති විසින් ප්‍රකාශ කර ඇතිබව සතුටින් සඳහන් කරමි.

**2.2.1 පැහැදිලි නොකළ වෙනස්කම්**

**2.2.3 <u>නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

**(අ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 19 වැනි වගන්තිය**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ගෑස් සමාගම් දෙක සමග ගෑස් මිල සම්බන්ධ මිල සූත්‍රයක් අනුව මිල තීරණය කිරීමට ගිවිසුම්වලට එළඹී ඇත. එම ගිවිසුම් ප්‍රකාර මාස 02කට වරක් සමාගම් දෙක විසින් මිල ප්‍රතිශෝධන ඉල්ලුම්පත් එවිය යුතුය. මෙය ලෝක වෙළඳපලේ මිල වැඩිවූ/අඩුවූ යන සියළු වකවානු සඳහා අදාල වේ. එබැවින් මෙය අදාල ගිවිසුම් යටතේ පාලනය විය යුත්තක් වන අතර, පනතේ 19 වගන්තිය අදාල කරගැනීමට අවශ්‍යතාවයක් පැන නොගනී.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම ප්‍රතිඵලය රු. 32,816,755ක අතිරික්තයක් වේ. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 26,050,936 ක වර්ධනයකි. මෙයට ප්‍රධාන වශයෙන් පුනරාවර්තන ලැබීම ඉහළයාම, ස්ථාවර තැන්පතු සඳහා පොළිය ලැබීම ඉහළයාම මගින් ආදායම ඉහළයාමක් එම ආදායම ඉහළයාමට සාපේක්ෂව වියදම ඉහළ නොයාමත් බලපාන ලදී.

3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

(අ) 2012 ජුනි 18 සමාගම් 06ක් විසින් වෙළඳපලට නිකුත් කරන ළදරු කිරිපිටි වර්ග 26ක් සඳහා උපරිම මිළක් නියම කර අංක 1763/4 දරන ගැසට් පත්‍රයක් නිකුත් කරන ලදී. එහිදී එක් සමාගමක්, එනම් නෙස්ලේ සමාගම පමණක් එයට විරුද්ධව නඩුවක් පවරන ලදී. එහිදී නීතිපති උපදෙස් අනුව අධිකාරිය විසින් එම ගැසට් පත්‍රය පරිච්චින්න කරන ලදී.

(ආ) අධිකාරියේ රාජකාරී කල වැඩ තහනමට ලක්වූ හිටපු අධ්‍යක්ෂ ජනරාල් R. K. ජයසූරිය මිය 2005.05.09 දින සිට 2006.10.12 දින දක්වා සේවය කරන ලදුව 2006.10.12 දින සේවයෙන් පහකරන ලදී. ඒ සම්බන්ධයෙන් ඇය අභියාචනාධිකරණයේ පැවරූ නඩුව නිෂ්ප්‍රභා වූ අතර නැවත ඊට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කොට එහිදී ඇතිවූ සමථය මත 2009.03.02 සිට වසරක පරිවාස කාලයකට යටත්ව අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ සේවයට බඳවා ගන්නා ලදී.

ඉහත පරිදි බඳවාගැනීමෙන් පසු නැවත 2010.02.18 දින සේවයෙන් පහකළ අතර එයට එරෙහිව ඇය කම්කරු විනිශ්චයාධිකරණයේ ඉල්ලීමක් යොමු කරන ලදී.

1. එම ඉල්ලීම විභාගවන අතරතුර 2013.11.20 දින කම්කරු උසාවියේදී නඩුව සමතයකට පත්කිරීම පිණිස රු.3,560,400 ක මුදලක් ගෙවීමට තීරණය කරන ලදී. ඒ අනුව එය ආයතනයේ වියදමක් විය. එහෙත්,මෙම නිලධාරිනිය අධිකාරියෙන් සේවය පහකිරීමට සිදුවූයේ අධිකාරියේ උන්නතියට හෝ සමස්ථ රටේ උන්නතියට වැදගත්වන තීරණයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිපාලන ශක්තියක් නොමැතිවීම හා/හෝ හිතාමතාම ඇය විසින් ඒවා ඉටුනොකිරීමත් ආයතනයේ ඉහළ කළමනාකරණය සමග සහයෝගයෙන් වැඩ කිරීමට හැකියාවක් නොමැතිවීමක් යන විශේෂ කාරණා අධ්‍යක්ෂ මණ්ඩලයේ සැලකිල්ලට භාජනයකර ඇයගේ සේවය වරින්වර දෙවරක් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකමතික තීරණය මත සේවය අවසන් කිරීමෙන් මේ බව මනාව ඔප්පු වේ. ඒ අනුව මෙම තීරණය ආයතනයේ සුබසිද්ධිය සඳහා ගනුලැබූ තීරණයකි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

(අ) කුකුළු මස් මිල වැඩි වීම

අධිශිතකළ සම සහිත බොයිලර් කුකුල් මස් වෙළඳපොළ තුල බහුල වශයෙන් විකිණෙන මස් වර්ගයක් වන අතර එහි මිල පාලනය කිරීම තුලින් වෙළඳපොළ තරගය හේතුවෙන් සම රහිත මස්ද අධික මිලට විකිණීම කළ නොහැක. තවද, මස් කඩ හරහා එවලෙම මරා විකුණන මස්වල වෙළඳපොළ කොටස, බොයිලර් කුකුල් මස්වල වෙළඳපොළ කොටස හා සසඳන කළ ඉතා සුළු ප්‍රමාණයන් ඉහත සඳහන් හේතූන් මත සම සහිත කුකුල් මස් මිල පාලනය කිරීම හේතුවෙන් සමරහිත කුකුල් මස් හා කරි චිකන් ආදී ලෙස විකුණන කුකුල් මස්වල මිල ඉහළයාමක් සිදු නොවේ.

පවතින විවෘත වෙළඳපල ආර්ථිකය තුල මිල පාලනය සිදුකිරීම සමස්ථ විවෘත ආර්ථික වෙළඳපොළට හානියක් සිදු නොවන ආකාරයට මිල පාලනය සිදුකළ යුතුය.

මෙහිදී රටේ සමස්ථ පාරිභෝගිකයාටම මෙන්ම වෙළෙන්දන්ටද හානියක් නොවන ආකාරයට මිල පාලනය කළයුතු නිසා සමසහිත කුකුල් මස් පාරිභෝගිකයන් බහුලව පරිභෝජනය කරනු ලබන ආකාරය අනුව පමණක් මිල පාලනය සක්‍රියව කරන ලදී. මෙහිදී සමසහිත කුකුල් මස් මිල පාලනය කිරීම නිසා ස්වයංක්‍රීයවම වෙළඳපොළ තුල ඉතා අඩු වෙළඳපොළ කොටසක් (market share) ඇති සම රහිත කුකුල් මස්වල (කොටස්ද ඇතුළුව) මිලද පාලනය වේ.

එබැවින් රටේ බහුතරයකට බලපාන පරිදි සෘජුවම මිලපාලනය සාර්ථක කර ඇති අතර, අඩු වෙළඳපොළ කොටසක් (market share) ඇත. සම රහිත කුකුල් මස් සඳහා වක්‍රව මිල ස්ථායිකරණයක් කිරීමට හැකිවී ඇති බව කාරුණිකව දන්වමි.

මහා භාණ්ඩාගාරයේ නියෝජිතයින් හා පශුසම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මගින් කොටස් වශයෙන් විකුණන කුකුල් මස්වල මිල පාලනයක් නොකළ යුතු බව දන්වන ලදී. එම කරුණ සැලකිල්ලට ගෙන කුකුල් මස් විකිණීම මිල පාලනයට යටත් නොකර 2014 අප්‍රේල් මස 22 වන දිනැති 1859/6 අංක දරණ ගැසට් පත්‍රය නිකුත් කරන ලදි.

(ආ) කිරි පිටි මිල වැඩි වීම

(i) සම්පූර්ණ යොදය සහිත කිරි පිටි

කිරිපිටි සමාගම් මිල වැඩිකිරීමට අයදුම්පත් එවා ඇත යන්න නිවැරදිය. විගණන විමසුමේ දක්වා ඇති පරිදි එක් සමාගමක් එනම් මැලිබන් සමාගම මිල වැඩි කර ඇත. මැලිබන් සමාගම කිරිපිටි 400g රු. 325/- සිට රු. 360/- දක්වා හා කිලෝ ග්‍රෑම් 1ක් රු. 810/- සිට රු.890/- දක්වා වැඩි කිරීම සඳහා 2013.04.05 දින අධිකාරිය වෙත අයදුම්පත් එවන ලද අතර එම ගණනය සඳහා අවශ්‍ය ලියකියවිලි නොමැති බැවින්, එම ලියවිලි ඉල්ලා 2013.04.22 දින යැවූ ලිපියට ප්‍රතිචාර නොදැක්වූ බැවින් 2013.05.02 දින පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 18 (4) වගන්තිය යටතේ අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලදී. නැවත 2013.07.17 දින ඉහත සඳහන් කළ අයදුම්පත සම්බන්ධ කර නැවත කිරිපිටි 400g සඳහා රු. 325/- සිට රු.425/- දක්වා හා කිලෝවක් සඳහා රු. 810/- සිට රු. 1060/- දක්වා මිල වැඩි කිරීමක් ඉල්ලුම් කළ අතර එය මුල් අයදුම්පත හා සම්බන්ධ බැවින්, එයට නිකුත් කළ අතුරු තහනම් නියෝගය වලංගුව පවතින බැවින් දින 30ක් ඇතුලතදී අධිකාරිය විසින් මිල අනුමත කිරීමක් සිදු නොකරන ලදී. මේ සම්බන්ධයෙන් මැලිබන් සමාගම අධිකාරියට විරුද්ධව පැවරූ නඩුව (විගණන විමසුමේ දක්වා ඇති පරිදි), සම්බන්ධයෙන් අධිකාරිය වෙනුවෙන් ඉහත කරුණු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. 2014.05.30 දින දරන ලිපියක් මගින් මැලිබන් සමාගම, අධිකාරිය අනුමත කළ මිලට ඔවුන් කිරිපිටි නිකුත් කරන බව දන්වා ඇත.පසුව මැලිබන් සමාගම විසින් එම නඩුව ඉල්ලා අස්කර ගන්නා ලදී.

(ii) යොදය රහිත කිරි පිටි

2003 වර්ෂයේ සිට යොදය රහිත හා යොදය සහිත කිරිපිටි මිල අයදුම්පත් සලකා මිල ගණන් ලබාදුනි. යොදය රහිත කිරිපිටි විශේෂත්වයෙන් සලකා ඉතා සුළු ප්‍රමාණයෙන් වෙළඳපලේ භාවිතය සලකා කිරිපිටි සඳහා මිල සංශෝධනයට අපවෙත අයදුම්පත් යොමු නොකොට මිලවැඩිකිරීම් සිදුකරන තත්ත්වය කිරීක්ෂණය වූ බැවින් 2014 පෙබරවාරි 21 දින යොදය රහිත කිරිපිටි නිෂ්පාදන සමාගම් වෙත මිල වැඩි කිරීමකදී අධිකාරියේ අවසරය ලබාගත යුතු බව දන්වන ලදී.

(ඇ) තිරිඟු පිටි මිල තීරණය කිරීම

විගණන විමසුමේ දක්වා ඇති කරුණු නිවැරදි වන අතර ඉදිරියේදී අධිකාරියේ පූර්ව අවසරයක් නොමැතිව මිල වැඩි වීමක් සිදුවුවහොත් ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්නා බවත් සමාගම් විසින් අයදුම්පත් ඉදිරිපත් කළ හොත් ඒ සම්බන්ධයෙන් දින 30ක් ඇතුලත කටයුතු කරන බවත් දන්වමි.

(ඈ) ලික්විඩයිට් පෙට්‍රෝලියම් (එල්පී) ගෑස් මිල තීරණය කිරීම

ගෑස් සමාගම් අධිකාරිය සමග ඇතුලත්ව ඇති ගිවිසුම් ප්‍රකාරව සෑම මාස 02කට වරක් මිල ප්‍රතිශෝධනයට ඉල්ලීම් කල යුතුව ඇතත්, එපරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර නොමැති බැවින් ගිවිසුම ප්‍රකාරව ගත් පළමු පියවර ලෙස මේ බව භාණ්ඩාගාර ලේකම් වෙත 2014.09.02 දිනැති ලිපිය මගින් ගැටළුව නිරාකරණය කිරීමට මැදිහත් වන ලෙස දන්වා ඇත.

(ඉ) පානීය ජල බෝතල්

පානීය ජලය ඇසුරුම් කිරීම සඳහා යොදා ගනු ලබන PET බෝතල්වල ශ්‍රී ලංකා ප්‍රමිතිය අනිවාර්ය කරන ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ඉල්ලීමක් සිදුකොට තිබූ අතර, අධිකාරිය විසින් ඒ සඳහා අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි.

මේ අතර ශ්‍රී ලංකා පානීය ජල බෝතල් නිෂ්පාදකයින්ගේ සංගමය විසින් අදාළ PET බෝතලවල ශ්‍රී ලංකා ප්‍රමිතිය සංශෝධනය විය යුතු බවට අදහස් පළ කරන ලද අතර, මේ පිළිබඳව ක්‍රියාත්මක වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, සෞඛ්‍ය අමාත්‍යාංශය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හා ශ්‍රී ලංකා පානීය ජල බෝතල් නිෂ්පාදකයින්ගේ සංගමයේ නියෝජිතයෙකු ද ඇතුළත් කමිටුවක් පත් කර ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි අවශ්‍ය සංශෝධනයන් සිදුකර දෙන මෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය දැනුවත් කොට ඇත. තවද PET බෝතල්වල ප්‍රමිතිය සංශෝධනය කිරීමේ දී ඇතුළත් විය යුතු කරුණු පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙත දැනුම් දෙන ලෙස ශ්‍රී ලංකා පානීය ජල බොතල් නිෂ්පාදකයින්ගේ සංගමය වෙත දැනුම් දී ඇත.

PET බෝතල් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබූ විගස එම ප්‍රමිතිය අනිවාර්ය කිරීමට අධිකාරිය විසින් පියවර ගන්නා බැව් කාරුණිකව දැනුම් දෙමි.

පානීය ජල බෝතල්වල මිල සම්බන්ධයෙන් මිලකරණ අංශයෙන් මූලික අධ්‍යයනයක් කර දෙවනුව පාරිභෝගික සභාව විසින් පානීය ජල බෝතල් නිෂ්පාදකයන් කැඳවා විමර්ශනයක් කිරීමෙන් අනතුරුව එහි නිර්දේශයන් පාරිභෝගික අධිකාරියෙහි අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සඳහා යොමුකර ඇති අතර, ඉදිරියේ දී පානීය ජල බෝතල් සඳහා උපරිම සිල්ලර මිලක් නියම කිරීමටද නියමිතය.

(ඊ) පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය

i. 2003 අංක 09 පාරිභෝගික අධිකාරිය පනතේ 49 (3) හි අ,ආ,ඇ,ඈ යන වගන්තීන් ප්‍රකාරව පාරිභෝගික ආරක්ෂණ අරමුදලින් මෙම වියදම් දැරිය හැකි බවට බලතල පවරා ඇත. ඒ අනුව පනත ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් මෙම පාරිභෝගික සේවා ව්‍යාපෘතිය සඳහා වියදම් දරන ලදී.

ii. මෙවැනි ව්‍යාපෘතීන්වල පවතින තාක්ෂණික තත්ත්වය සලකා එම මාදිලියේ ව්‍යාපෘතීන් දියත් කර ඇති ආයතන මගින් පමණක් මිලගණන් කැඳවීමට කළමනාකරණය තීරණය කළ බැවින් තෝරාගත් සුදුසුකම් ලත් අයතනවලින් පමණක් (සීමිත මිලගණන්) අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය මත මිලගණන් කැඳවන ලදී.

iii. පාරිභෝගික සේවා ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් අස්පෘෂ්‍ය (Intangible) වත්කමක් වශයෙන් සැලකෙන අතර එය සමස්ථ පාරිභෝගික ජනතාව වෙත සපයන සේවාවකි. එම සේවාවේ මූල්‍ය අගය කොටස් 02කි. එනම්,

01. සපයනු ලබන සේවාව (Soft ware)

02. එම සේවය සැපයීමට දායක වන දෘඩාංග හා පද්ධති පිරිවිතරයන් (Hardware)

මෙහි වැදගත්ම හා අත්‍යාවශ්‍ය කොටස වන පාරිභෝගික සේවා විමසුම ව්‍යාපෘතියේ මෘදුකාංගයේ (soft ware) හිමිකාරිත්වය පාරිභෝගික අධිකාරිය වෙත හිමිව ඇත.
එම සේවාව සැපයීමට පාදක වන දෘඩාංග කිහිපයක් පහත සඳහන් වේ. එනම්,

01. Voice (IVR/OBD) plattorm
02. Application server
03. Subscription server plattorm
04. DB server

මෙවැනි ව්‍යාපෘතියක සාර්ථකත්වය සඳහා මෙම උපකරණ සැමවිටම පැය 24 පුරාවටම ක්‍රියාකාරී සේවයේ තිබිය යුතුය. එසේ ක්‍රියාකරවීමට විශාල විදුලි ජනක යන්ත්‍ර මෙන්ම එකිනෙකට වෙනස් server සහ වෙනත් ඉහත සඳහන් දෘඩාංග අවශ්‍ය වේ. මේවා මිලට ගැනීමට විශාල මුදලක් වැයකල යුතු අතර සමහර දෘඩාංග ඇත්තේ මහා පරිමාණ සන්නිවේදන ආයතන සතුව පමණි. ( ශ්‍රී ලංකා ටෙලිකොම්, ඩයලොග් වැනි ආයතන) එමෙන්ම මෙම උපකරණවල දෝෂයන් ඇතිවීමේදී ඒවා නිවැරදි කරගැනීමටද විශාල තාක්ෂණ දැනුම අවශ්‍ය වේ.

ඒ අනුව මෙම උපකරණ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැයකිරීම, තාක්ෂණය පිළිබඳ ගැටළු, එකිනෙකට වෙනස් සේවාදායකයන් සමග කටයුතු කිරීමට සිදුවීම ආදී ප්‍රායෝගික තත්ත්වයන් සැලකිල්ලට ගෙන අධිකාරිය එම සේවාව සපයන ආයතනවලින්ම සපයාගැනීම වඩාත් සුදුසු හා ප්‍රායෝගික වූ බැවින් මෙම විශේෂිත මෘදුකාංග සංවර්ධනය කළ ආයතනය හරහා මෙම සේවාව සපයාදීමට පවරන ලදී. ඒ අනුව මෙම සේවාව කාලසීමාවකට යටත්ව ලබාගත් සේවාවන් වේ.

iv. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු. මි. 60ක් වුවත් එම ව්‍යාපෘතිය රු. 5.4න් අවසන් කිරීමට හැකි වූ බැවින් තවදුරටත් ප්‍රතිපාදන අවශ්‍ය නොවේ. තවද මෙම ව්‍යාපෘතියක් පනතේ ඇති ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළහැකි බැවින් මේ සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ඉල්ලා සිටියේ නැත. කෙසේ වෙතත් ඉදිරියේදී මෙවැනි ව්‍යාපෘති සඳහාද භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමෙන් කටයුතු කිරීම වඩාත් සුදුසු බැවින් ඒ අනුව කටයුතු කරනු ඇත.

4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2008.01.25 වන දින නිකුත් කළ විධාන අංක 19 පරිච්ඡින්න කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුවෙන් අධිකාරිය වෙත ලැබූ උපදෙස් පරිදි අදාල විධානය 2013.07.29 දින පරිච්ඡින්න කිරීමට පියවර ගන්නා ලදී.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) (i) 2013 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ පුරප්පාඩුව පැවති තනතුරු සඳහා මේ වන විට කාර්යය මණ්ඩල බඳවාගෙන ඇති අතර පහත සඳහන් තනතුරු සඳහා සුදුසු අයදුම්කරුවන් අභ්‍යන්තර හෝ බාහිර වශයෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත්ව නොමැති බැවින් එම තනතුරු පමණක් දැනට පුරප්පාඩුව ඇත.

1) ජ්‍යෙෂ්ඨ කළමණාකරු HM 1-1 - අධ්‍යක්ෂ (මිල හා කළමනාකරණ)

2) කණිෂ්ඨ කළමනාකරණ JM 1-1 - බඳවා ගැනීමේ පටිපාටිය අනුව මෙම තනතුර සඳහා බඳවා ගත හැකිවන්නේ අභ්‍යන්තර අයදුම්කරුවන් අතරින් සුදුසු අය පමණක් වේ. (බාහිර අයදුම්කරුවන් මේ සඳහා බඳවා ගත නොහැක.) ඒ අනුව පහත සඳහන් තනතුරු සඳහා අභ්‍යන්තරයෙන් බඳවා ගැනීමට සුදුසු නිලධාරීන් ඉදිරිපත්ව නොතිබුණි. එබැවින් බාහිරින් සුදුසු අය බඳවා ගැනීමට බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමට දැනටමත් අමාත්‍යාංශයේ ලේකම් මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අංක CAA/HRA/DMS/01 හා 2013.09.27 දිනැති හා අංක CAA/HRA/DMS/01 හා 2014.01.03 දිනැති ලිපි මගින් යොමු කර ඇත.

(II) සහකාර අධ්‍යක්ෂක සහ නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුරු 2 ක MM වැටුප් බාන්ඩයේ I ශ්‍රේණිය හා II ශ්‍රේණිය ලෙස පවතින ශ්‍රේණි 2 ක් ලෙස බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන්ව ඇත. ඒ අනුව නිලධාරියෙකු මුලින්ම MM1-1 වැටුප් කාණ්ඩයේ II ශ්‍රේණියට බඳවාගෙන වැටුප් පියවර 12 කට පසුව බඳවා ගැනීමේ පටිපාටිය යටතේ උසස් කිරීමට අදාලවූ අනෙක් අවශ්‍යතා සපුරා ගැනීමෙන් පසුව I ශ්‍රේණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුරට උසස් කෙරෙනු ඇත.

තවද 2013 පෙබරවාරි 01 දින සිට සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුරුවලට උසස් කර ඇත්තේ නව බඳවා ගැනීමේ පටිපාටියෙ අනුමත කරන ලද 2012/08/08 දිනට පෙර පැවති බඳවා ගැනීමේ පටිපාටින්හි විධිවිධාන අනුව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ වල ප්‍රතිඵල හා අධ්‍යක්ෂක මණ්ඩල අනුමතීන්ට අනුව බව සඳහන් කරමි.

(III) නියෝජ්‍ය අධ්‍යක්ෂක මානව සම්පත් පරිපාලන නිලධාරිනිය අධ්‍යක්ෂ ජෙනරාල්ගේ ගේ අනුමැතිය පරිදි මිල හා කළමනාකරණ අංශය වෙත තාවකාලිකව අනුයුක්ත කර ඇත. මිල හා කළමනාකරණ අංශයේ සේවයේ නියුතු සහකාර අධ්‍යක්ෂක (මිල හා කළමනාකරණ) සමඟ එක්ව එම අංශය මගින් මෙහෙය වන අධිකාරියේ විශේෂ ව්‍යාපෘතියක් වන ඖෂධ මිල නියාමන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු සඳහා ඇයව තාවකාලිකව අනුයුක්ත කර ඇත .

(IV) අධ්‍යක්ෂ (මිල හා කළමනාකරණ) තනතුර සඳහා 2013 ජුනි මාසයේදී සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද අතර ඉදිරි පත් වූ අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් එම තනතුරේ පවතින කොන්දේසි වලට (වැටුප් පරිමාණ ඇතුළු කොන්දේසි) එකඟ නොවූ බැවින් බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් සහිත අයදුම්කරුවකු සොයා ගැනීමට නොහැකි වී ඇත.

(V). විගණන නිලධාරි තනතුර අධිකාරියේ කාර්ය මණ්ඩලයේ JM 1-1 එක එක වැටුප් කාණ්ඩයට අයත් වන අතර අභ්‍යන්තර අයදුම්කරුවන් අතරින් පමණක් සුදුසු අය බඳවා ගත යුතු තනතුරකි .ඒ අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වා 2013.08.01 දින සිට අභ්‍යන්තර නිළධාරියකු විගණන නිළධාරී තනතුර පත් කිරීමට පත්වීම් ලිපිය නිකුත් කර තිබූ අතර එම අය තනතුර බාර නොගන්නා ලදී.එබැවින් සුදුසු අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති හෙයින් එම තනතුර පුරප්පාඩුව පවතී. ඒ අනුව බාහිරින් අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා විශේෂ අනුමැතියක් ලබා ගැනීමේ අරමුණින් අමාත්‍යාංශය වෙත අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අත්සනින් (CAA/HRA/DMS/01) 2013/01/07 දිනැති ලිපිය හා අංක (CAA/HRA/DMS/01) හා 2014/01/03 දිනැති ලිපිය අනුව අමාත්‍යාංශයේ ලේකම් මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇත.

(ආ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මාධ්‍ය නිලධාරියෙකු ලෙස කටයුතු කල අය 2013 ජුනි 30 දක්වා අධිකාරියේ සේවය කර තිබූ අතර එම අය 201/03/15 දින සිට අමාත්‍යාංශ වෙත වැඩ භාර ගත් බව අධිකාරිය වෙත දැනුම් දී නොතිබුණි. කෙසේ වෙතත් එලෙස මාස තුනහමාරක කාලයක් සඳහා අතිරේකව ගෙවන ලද වැටුප් හා අනෙකුත් මුදල් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විමසා එවැනි අතිරේක ගෙවීම සම්බන්ධයෙන් එම නිලධාරියා වෙතින් අය කර ගැනීමට අදාලව කටයුතු කළ බව කරුණිකව දන්වමි.

5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම - 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් කර ඇත.

මෙම තත්ත්වය හැකි උපරිමයෙන් අවමකර නියමිත කාලසීමාවක්තුල කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව කාරුණිකව දන්වමි.

5.2 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දුන් නියෝග ක්‍රියාත්මක කිරීම

(අ) 2012.10.03 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් අප වෙත ඉදිරිපත් කර තිබූ සියළු කාරනා සම්බන්ධයෙන් පිළිතුරු ලබාදෙන ලදී. එහිදී පනතේ 6 වගන්තිය ප්‍රකාරව එහි ප්‍රතිපාදන ඇති බැවින් අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 වන පන්තියේ (මේ වන විට විශේෂ ශ්‍රේණියේ) නිලධාරියකු බඳවාගත් බව දැනුම් දෙන ලදී. ඒ අනුව 2014.02.20 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී විමසීමක් කර නොමැති බව කාරුණිකව දන්වමි.

(ආ) ඉහත සඳහන් පරිදිම මේ සම්බන්ධව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත පිළිතුරු සපයන ලද අතර, 2014.02.20 දින පොදු ව්‍යාපාර පිළිබඳ වාර්තාවේ මේ පිළිබඳ වාර්තා වී නැත. කෙසේ නමුදු මෙම මුදල් එවකට අභ්‍යන්තර වෙළඳ හා සමුපකාර අමාත්‍යාංශය ප්‍රතිපූරණය කිරීමට එකග බව ප්‍රකාශකර පොදු ව්‍යාපාර කමිටුව වෙත දන්වා ඇති අතර ඒ බව දැනට එම අමාත්‍යාංශය අයත් ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ අමාත්‍යාංශය වෙත සිහිකැඳවීම් කර ඇති අතර ඔවුන් එම මුදල ගෙවන බව නැවතත් සතාප කර ඇත.

## 6. පද්ධති හා පාලනයන්

අ සිට ඇ දක්වා කරුණු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස පවත්වාගෙන යාම සඳහා කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.



ආචාර්ය ආර්. එම්. කේ. රත්නායක
සභාපති